## 2013 – 05 – 07 වන දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පැවති මාසික සභා රැස්වීම් වාර්තාව

**සහභාගීත්වය :-**

| | | |
|---|---|---|
| **01.** | එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා | ගරු සභාපති |
| 02. | කමල් වැල්ලගේ මහතා | ගරු උප සභාපති |
| **03.** | ඒ. පී. ලක්ෂ්මි හේමන්තා සිල්වා මෙනවිය | ගගරු සභාපතිරු නගර සභා මන්ත්‍රී |
| **04.** | එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **05.** | එච්. එල්. අනුර කිත්සිරි මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| 06. | පී. සරත් ශ්‍රීලාල් මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **07.** | ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **08.** | ඒ. ඩබ්. ජගත් කුමාර මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **09.** | ජේ. ඩබ්. ජයන්ත මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **10.** | ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **11.** | කේ. එම්. චන්ද්‍රසිරි මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **12.** | බී. ජනිත් වික්‍රමතිලක මහතා | ගරු නගර සභා මන්ත්‍රී |

☸ පන්සිල් සමාදන් වීමෙන් අනතුරුව පෙ. ව. **09.30** ට රැස්වීමේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී. ☸

**(01)**

**01:01 2013 – 04 – 02 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම**

2013 – 04 – 02 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

✠ **ඒ අනුව 2013 - 04 – 02 දින පවත්වන ලද මාසික සභා වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

## (02) සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන

## (03) ලැබී ඇති පැමිණිලි පෙත්සම් හා ලිපි සභාවට ඉදිරිපත් කිරීම

**3:1** " 2013 වර්ෂය සඳහා අනුමත මිල ගණන් - වාරි මාර්ග " මැයෙන් දකුණු පළාත් පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා විසින් එවා තිබූ ලිපිය සභාගත සභාගත කිරීම.

දකුණු පළාත් පාලන දෙපාර්තමේන්තුවේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් 2013 වර්ෂය සඳහා අනුමත මිල ගණන් (වාරා මාර්ග) ඉදිරිපත් කර තිබුණි

<u>තීරණය</u>

☞ **මෙම ලිපිය සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.**

**3:2** " පරිගණක දත්ත ක්‍රියාකරුවෙක් ලබා ගැනීම සඳහා " මැයෙන් අම්බලන්ගොඩ නගර සභාවේ මහජන පුස්තකාලයේ පුස්තකාලයාධිපතිනිය විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සභාගත කරන ලදී.

ඉදිරියේදී පුස්තකාල සේවාවන් පරිගණක ගත කිරීමට අදහස් කර ඇති බැවින් ඒ සඳහා සුදුසුකම් ලත් නිලධාරියෙකු පුස්තකාලයට ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **අම්බලන්ගොඩ මහජන පුස්තකාලය සඳහා පරිගණක දැනුම ඇති සුදුසුකම් සහිත අයෙකු තාවකාලිකව බඳවා ගැනීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී .**

**3:3** " වෙසක් තොරණ සඳහා අවසර ලබා ගැනීම " මැයෙන් 2013. 04. 29 දාතමින් සී ඩ්‍රැගන්ස් බෞද්ධ සමිතියේ විසින් එවන ලද ලිපිය සභාගත කරන ලදී.

සී ඩ්‍රැගන්ස් බෞද්ධ සමිතිය මගින් 21 වන වරටත් සංවිධානය කරන වෙසක් තොරණ 2013 මැයි මස 24 සිට 29 දක්වා අම්බලන්ගොඩ තානායම අසලදී ප්‍රදර්ශනය කරනු ලබන බවත් ඊට සමගාමීව මුවලින්ද නාගදරණය සහ මැජික් සංදර්ශන ප්‍රද්ර්ශනයක්ද පැවැත්වෙන බවත් එය විනෝද බදු වලින් නිදහස් කර දෙන ලෙසත් මැජික් සංදර්ශනය අම්බලන්ගොඩ තානායම් භූමිය තුල ප්‍රදර්ශනය කිරීමට අවසර ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

**<u>ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

මේකෙ ගියපාර පාර කඩන කොට එගොල්ලො පොරොන්දු වුනා පාර කඩන තැන් වහල දෙනවයි කියලා. නමුත් මේ ලියුම ඉදිරිපත් කරන තුරුත් මේව වහල නෑ. එගොල්ලන්ගෙ පොතක තිබුන අපේ පාරෙ තමයි මේ තොරණෙ 90% ක්ම තිබුනෙ නමුත් ස්තුති කරල තිබුනෙ මාර්ග සංවර්ධන අධිකාරියට. විනෝද බදු නිදහස් කිරීම සම්බන්ධයෙන් නගර සභාවට ස්තුති කරල තිබුණ. .

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්ලිව්. ජගත් කුමාර මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි බෞද්ධාගමික කටයුත්තක් නිසා අඩුම මුදලක් අය කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි මෙහෙම දෙයක් කරන එකත් ලොකු දෙයක්. ඒ අය මේව වහපු නැති එකත් වරදක් තමයි. ඒනිසා ඒඅ යට මේ වරද පෙන්නල දෙන්න.

<u>තීරණය</u>

☞ **මේ සම්බන්ධයෙන් සාකච්ඡා කල සභාව මැජික් සංදර්ශනය සඳහා තානායම් භූමිය ලබා දීමටත් මැජික් සංදර්ශනය සහ මුචලින්ද නාගදරණය ප්‍රදර්ශනය සඳහා අය කරනු ලබන ගාස්තු විනෝද බදු වලින් නිදහස් කිරීමටත් පලුදු කිරීම් කරනු ලබන මාර්ගය ප්‍රතිසංස්කරණය සඳහා වන ගාස්තු අය කර ගැනීමටත් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**3:4** " අම්බලන්ගොඩ නගරය " මැයෙන් ජේ. අයි ද සිල්වා මහතා විසින් එවන ලද නගර වැසියන් විසිහත් දෙනෙකුගේ අත්සනින් යුතුව එවන ලද ලිපිය සභාගත කරන ලදී.

අම්බලන්ගොඩ නගරයේ පැරණි ගොඩනැගිලි ඉදි කර ඇත්තේ සැලැස්මකට අනුව බවත් නාගරික සංවර්ධන අධිකාරියට පවරා ගැනීමෙන් පසු සැලැස්ම අමතක කර ගොඩනැගිලි ඉදි කරනු ලබන බවත් අම්බලන්ගොඩ නගරයේ වෙරළට සමාන්තරව මාර්ග තුනක්ම පිහිටා ඇති බවත් කොළඹ හම්බන්තොට මාර්ගය උතුරු මායිමේ සිට ඇල්පිටිය මාර්ගය පටන් ගන්නා ස්ථානය දක්වා දක්වා අඩි 100 ක් ලෙසද එතැන් සිට දකුණු මායිම දක්වා ඇති මාර්ගයෙහි අඩි 60 ක් වන සේද වීථි රේඛා සටහන් කිරීමට කටයුතු කරන ලෙස ඉල්ලා තිබුණි.

**<u>ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

විථි රේඛා ලකුණු කිරීමේ බලයක් සභාවට නැහැ. පාර්ලිමේන්තු පනතකින් පනවල තියෙනව ගාලු පාරත් අලුත් පාරත් දෙකම අඩි 100 වන සේ ගොඩනැගිලි සීමාවන් දක්වන්න කියලා. ඒ අනුව දැනට කරන් ලබන ඉදිකිරීම් වලට පාර මධ්‍යයේ සිට අඩි 50 බැගින් අඩි 100 වනසේ තමයි ලකුණු කිරීම් කරන්නෙ. මෙහිදී අපි බලන්න ඕනෙ නගරය මැදින් අඩි 100 ගානෙ පාරවල් දෙකක් ගියොත් අඩි 200 ක් නගරය මැදින් අයින් වෙනවා. අපි කියන්න ඕනෙ මාර්ග සංවර්ධන අධිකාරියට පරණ ගාලු පාර මේ අඩි 100 න් ඉවත් කරන්න කියලා. අලුත් පාර අඩි 100 ට පවත්වා ගැනීම වඩා සුදුසුයි මා හිතන ආකාරයට. අපි නගරයේ වැසියන්ට හිරිහැරයක් නොවන සේ යෝජනා කිරීම අපේ යුතුකමක්. මේ පිළිබඳව සාකච්ඡා කරන්නෙ පාර්ලිමේන්තුවේ මාර්ග සංවර්ධනය පිළිබඳ තේරීම් කාරක සභාවෙදි. අම්බන්ගොඩ නගරය

සම්බන්ධව කතා කරන්න සැම විටම පාර්ලිමේන්තු නියෝජනයක් නැති වෙලා තියෙනවා. ඒක තමයි අපට තියෙන අවාසිදායක තත්වය. එනිසා අපි සභාව වශයෙන් මේ සම්බන්ධයෙන් මැදිහත් වෙන්න වෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි අපේ නගරයට අවශ්‍යතාවක් වන ගාලු පාර අඩි 100 දක්වා පුලුල් කිරීම සිදු කිරීමට නොහැකි වෙලා තියෙනවා. සියලු දෙනාගේම හිත් හොඳ වෙන දියට මේක කරන්න ගියොත් අම්බලන්ගොඩ නගරයේ අනාගත සංවර්ධනය සීමා විමක් වෙනව සභාපතිතුමනි. ව්‍යාපාරිකයන් අපේ නගරය තුලම රඳවගෙන ඉදිරි පරම්පරාවට නගරය සංවර්ධනය කර දිය යුතුයි. අපි ඉල්ලා සිටින්නෙ අඩි 60 ක් නෙමෙයි අඩි 30 ක් තියන්න කියල. අපට තව කාලෙකින් හිතේවි අඩි 100 ත් මදියි කියලා. හොඳම උදාහරණය තමයි ගාල්ල නගරය. අපිත් හිතුව කුඩා ව්‍යාපාර අතුගෑලා යයි කියල. නමුත් වුනේ ඇත්තටම ගාල්ල නගරය ප්‍රතිනිර්මාණය වීමක්. අපි සමීක්ෂණයක් කරා සභාපතිතුමනි. ගාල්ලෙ ව්‍යාපාරික මහත්වරු කියනව එදාට වඩා ව්‍යාපාර තත්වයන් දියුණු වෙලා තියෙනවා කියලා. අද වන විට කරන්දෙනිය බද්දේගම වැනි ප්‍රදේශ දියුණු වෙලා තියෙනවා. අපි මේ ගාලු පාර පුලුල් නොකරොත් ඒක අපේ ආර්ථිකයට බලපානව. සංස්කෘතියට බලපානව. මෙහිදී අපි අම්බලන්ගොඩ නගරයේ පුරවැසියන් හැටියට පෙල ගැහෙමු කියල ඉල්ලා සිටිනව සභාපතිතුමනි. මේදේ අපේ නගරයේ අධ්‍යාපනයටත් බලපානව. මේ කිලෝමීටර් එකහමාර දෙක පහු කරන්න විනාඩි විස්සක් විතර යනවා. අම්බලන්ගොඩ නගරයට දවසකට පිවිසෙන ප්‍රජාව 40000 කට වැඩි වුනා 1994 දි. දැන් වෙන කොට ලක්ෂයක් පනිනවා ඇති. මිනිස්සුන්ගෙ කාලය ඉතාම වටිනවා. රට ඉදිරියට යන වෙලාවෙ මේ දේවල් ගැන අපි අවධානය යොමු කරන්න ඕනෙ. මේ සම්බන්ධයෙන් අපේ ප්‍රධාන අමාත්‍යතුමා දැනුවත් කරල පක්ෂ විපක්ෂ සියලුම මන්ත්‍රීවරුන් දැනුවත් වෙලා නාගරික සංවර්ධන අධිකාරිය භාරව සිටින ආරක්ෂක අමාත්‍යතුමා දැනුවත් කරල මේ සම්බන්ධයෙන් කතිකාවතක් සූදානම් කරන්න කියල මම ඉල්ලීමක් කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි මේක අපිට කරන්න බැහැ. පාර්ලිමේන්තුවේ තේරීම් කාරක සභා වලින් තමයි කෙරිය යුත්තේ. මෙය කල යුත්තේ මන්ත්‍රීවරයෙකු මගින් නම් මම ඔබ තුමාගෙන් ඉල්ලා සිටිනවා අපේ නගරයේම පදිංචිව සිටිනවා සජින් වාස් ගුණවර්ධන මහත්මය. මම හිතනව එතුමාට මේ ඉල්ලීම ලබා දීල ඒක පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවට ඇතුල් කරන්න සැලැස්සුවොත් අපේ මේ බලාපොරොත්තුව ඉෂ්ඨ කර ගන්න පුලුවන්. ඒක නගර සබාව වෙනුවෙන් ඕනෑම මන්ත්‍රීවරයෙකුට කරන්න පුලුවන්. මම එදා දක්වපු අදහසම තමයි අදත් දක්වනනෙ. කෙරිය යුත්තෙ තේරීම් කාරක සභාවට ගොස් අපට තියෙන අඩුපාඩු පෙන්නල මිනින්දෝරු සැලැසැමක් සකස් කරල එතකොට අපට දත්ත ඇතුව මේක පෙන්වන්න පුලුවන්. මේක කතා කරාට අවබෝධයක් වෙන්නෙ නැහැ. සැලැස්මෙන්ම පෙන්නන්න ඕනෙ. ඔබතුමා එතනට කැඳෙවුවොත් වඩා හොඳයි. එහිදී අපිට පෙන්නන්න පුලුවන් මේ පාරවල් දෙකෙන් අපිට කොපමණ ඉඩ ප්‍රමාණයක් නාස්ති වෙනවද කියන එක. අපි පක්ෂ විපක්ෂ භේදයක් නැහැ. අපපේ නගරයට හානියක් වෙනව නම් අපි ඒ දේදි එකතු වෙනවා. අපි මේ රැස්වීමේ කොච්චර කතා කරත් මේක වෙන්නෙ නැහැ. යායුත්තේ තේරීම් කාරක සභාවට පමණයි. මේකට නගර සභාවෙන් මුදලක් වියදම් වුනත් කමක් නැහැ. මම ඉල්ලා සිටිනවා මේදේ ඒ විදියට සිදු කරන ලෙස.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි මම හිතන්නෙ හොඳ අදහසක් ජයන්ත මහත්මය ඉදිරිපත් කරේ. අවශ්‍යතාවය තිබුණ වගේම ඒක අදාල ආයතන වලට පෙන්නල දෙන්න ඕනෙ. මට දැනගන්න ඕනෙ සභාපතිතුමනි මේ නගරයේ තියෙන පාරවල් ඉඩම් ඒ සියල්ල සම්බන්ධව සැලසුමක් නැද්ද. ඔබතුමා මේකට උත්සාහ අරගෙන කරන්න කියල අපි ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

තියෙනවා. නවීන ක්‍රමවේදයන්ට අනුවයි පැරණි ක්‍රමවේදයන්ට අනුවයි දෙකෙන්ම තියෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි ගාලු පාර සම්බන්ධයෙන් තීරණ ගැනීමේදී වැදගත් තීරණයක් අපිට ගන්න වෙනවා. අම්බලන්ගොඩ නගරයේ උත්සව කාල වලදී මෙන්ම දිනපතාම පාසල් වේලාවන් තුලදී සෑහෙන තදබදයක් ඇතිවෙනවා. පසුගිය දිනවල තිබුණ වැඩ මුලුව තුලත් මේ සමබන්ධව දීර්ඝ වශයෙන්ම ඔබතුමා කරුණු ඉදිරිපත් කරල සාකච්ඡා කරා. මේ නගරයේ තියෙන සමහර ඉඩම් නගරෙට වැදගත් නොවන ආකාරයට තමයි තවමත් පවතින්නෙ. වාරිමාර්ග දෙපාර්තමේන්තුව පවතින ඉඩම ඉන් එකක්. ඔබතුමාගෙ අදහසක් තියෙනවා අපෙත් අදහසක් තියෙනව රාජ්‍ය ආයතන සියල්ල එතනට ඒකාබද්ද කරල එතන සංවර්ධනය කරන්න. අපි විපක්ෂයේ හිටියත් නගරයේ සංවර්ධනය කාටත් පොදුයි. අඩි 100 ට මේ ගාලු පාර පළල් වෙන්න ඕනෙ. එහිදී වෙළෙන්දන්ට යම් දෙයක් අහිමි වෙනව නම් ඒ අයට ස්ථාන ලබා දිය යුතුයි. අපි සෘජුව ඉන්නව පාර පුලුල් කර යුතුයි කියන මතේ. මේ සම්බන්ධව දේශපාලන සහයෝගය අරගෙන මේ කටයුත්ත කරන්න හොඳම කාලය තමයි මේ කාලය. අපිත් මේ කටයුත්තට ඔබතුමන්ලාට සහයෝගය දෙන්නෙ තව අවුරුදු 50 ක් 100 ක් ගැන හිතල. මේ පිලිබඳව ඔබතුමන්ලා ඉදිරි කටයුතු කරන්න කියන ඉල්ලීම කරමින් නිහඬ වෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කථා කරමින්,</u>**

ගරු සභාපතිතුමනි මන්ත්‍රීවරුනි මාධ්‍යවේදී මහතුනි මෙම ලිපිය අනුව අපි දකිනවා නගරය පාලනය කරන අය විදියට සෑම ආයතනයකටම එම ආයතනය සම්බන්ධව ඉදිරි සැලසුම් තියෙනවා. මෙහි මහජනතාවට චිරාත් කාලයක් වැඩි පහසුකම් ලැබෙන විදියට සුව පහසුව සකස් කිරීම අපේ යුතුකම වෙනවා. ඒකෙ මූලික වගකීම ඉටු කරන්නෙ නාගරික සංවර්ධන අධිකාරිය. ඔවුන් දස අවුරුදු සැලසුම් සභාවට ඉදිරිපත් කරල තියෙනවා. අලුත් පාර අඩි 100ට පළල් කිරීමත් මුහුදු වෙරළ පාර අඩි 60 ක් හෝ 80 ක් දක්වා පළල් කිරීමත් යන කාරණා. ඒ සැලසුම් වගට අනුව අපි කොහොමත් කටයුතු කල යුතුව තිබෙනවා. ඒ කාල වලදි ඉඳපු සභාවල් ඒවට අනුමැතිය දීල තියෙනව අදටත් ඒව ප්‍රායෝගිකයි. ඒව තීන්දු කරාට පස්සෙ වෙනස් වීම් වෙන්නෙ කලාතුරකින්. අලුත් පාර පළල් කිරීමේ වුවමනාව අපට එන්නෙ කලපහුගිය කාලවල අම්බලන්ගොඩ නගරය පහු කරන්න වාහනයකට විනාඩි විස්සක් පැය භාගයක් පමණ ගත වුනා. එතනින් තමයි මේ යෝජනාව පටන් ගන්නෙ. ඒ ආ ගමන මේක හදිසි වෙලා අපි යෝජනා කරා අලුත් පාර අඩි 100 ට පළල් කරන්න. නමුත් හදිසි යෝජනාවක් විදියට රජයට වුවමනාව තිබුන මුහුදු වෙරළ පාර තමයි පළල් කිරීම තමයි ඉතාම අඩු වියදමකින් කරන්න පුලුවන් කියන තැනට ඒ නිලධාරීන් එන්න ඇති.. මෙතන දේශපාලන අධිකාරියේ සම්පූර්ණ එකගතාවය තියෙනවා. දැන් ඒ තත්වය වෙනස් වෙලා. අධිවේගී මාර්ගය විවෘත වීම නිසා දැන් ඒ තදබදය නැහැ. මෙම ව්‍යාපෘතිය මම දකින්නෙ ඉතා විශාල ව්‍යාපෘතියක් විදියට. මේකෙ වන්දි ගෙවීම සරල කාරණාවක් නෙමෙයි. මේකෙ අඩි 100 පාර්ලිමේන්තු පනතෙන් සම්මත වෙලා තියෙන්නෙ. අතීතයේදී උප සභාපතිවරයෙකුව සිටි විල්ෆ්‍රඩ් ද සිල්වා මැතිතුමා ඕක අඩි 60 ට සංකෝචනය කරල මේ සභාවෙ අනුමත කරගෙන එතුමගෙ කඩේ බේර ගත්ත. අදටත් අඩි 60 සීමාවෙදි අපි මේ සියලුම ගොඩනැගිලි වලට අනුමැතිය දීල අද විශාල ප්‍රශ්නයක් වෙලා තියෙනවා ආර්. ඩී. එක අපෙන් අහනව කවුද මේවට වන්දි ගෙවන්නෙ. ඒකට උත්තර නැහැ. ඒ වරදම අපි ඉදිරියටත් කරනවද. කොහෙන්ද මේ අඩි 60 සීමාවට අනුමැතිය ගන්නෙ. මොන ආතතයෙන්වත් දෙන්නෑ. පාර්ලිමේන්තු පනතකින් අනුමත වෙච්ච ගැසට් එකක් අනු නීතියකින් වෙනස් කරන්නෙ කොහොමද. කඩ හිමියන්ගෙ ඉල්ලීම් වල සත්‍යතාවක් තියෙනව. ඒකට ගත යුතු ක්‍රියාමාර්ග සභාපතිතුමා දක්වල තියෙනවා. අද ගාල්ල මාතර නගර විදියට දිස් වෙනවා. අම්බලන්ගොඩටත් ඒ අයිතිය

තියෙනවා. මේකෙ ප්‍රශ්නෙ තියෙන්නෙ මේකට අපි ප්‍රතිපාදන ගන්නෙ කොහොමද කියන එක. අපි අඩි 100 ට පාර පළල් කරල අහිමි වන වෙළෙන්දන්ට ඔබතුමා සභාවෙ මට්ටමින් අවශ්‍ය කටයුතු කරන්න.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

මේ සම්බන්ධව අපි ලබන ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවෙදිත් සාකච්ඡා කරනවා. පසුගිය දින පහක පැවති වැඩ මුලුවේදීත් අපි මේ ගැන සාකච්ඡා කරා. අපි සාකච්ඡා කරා අම්බලන්ගොඩ බස් නැවතුම් පොලත් දුම්රිය ස්ථානයත් යන ස්ථාන උඩින් ස්ලැබ් එකක් දාල ඒ තුල නව වෙළඳ සංකීර්ණයක් එවගේම වාහන නැවතුම් ස්ථාන සියලු දෙනාට සැපයිය හැකි මට්ටමින් නව නගරයක් ඉදි කිරීම සඳහා සැළැස්මක් සහ රජයේ කාර්යාල සියල්ලම වාරිමාර්ග ඉඩමට ගෙනිහිල්ල සියලු දෙනාම එකම වහලක් යටට ගෙනිහිල්ල ජනතාවට සේවය කිරීමට ගොඩනැගිල්ලක් ඉදි කිරීමටත් එම හිස් වෙන ස්ථාන නගරයේ පාර්කින් සහ වෙනත් වෙළඳ අගයක් තිබෙන කටයුතු සඳහා යොදා ගැනීමටත්. අපිට බලය නෑ පාර්ලිමේන්තු පනත ඉක්මවල කටයුතු කරන්න. මේ සම්බන්ධයෙන් අපි ඉදිරියටත් කටයුතු කරනවයි කියන බව දන්වනවා.

<u>තීරණය</u>

☞ **මේ සම්බන්ධයෙන් සාකච්ඡා කල සභාව අලුත් පාර අඩි 100 දක්වා පුලුල් කිරීමට අදාලව 2013-05-09 දින ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේදී සාකච්ඡා කිරීමටත් මාර්ගය පුලුල් කිරීම සම්බන්ධව ඉදිරි කටයුතු සිදු කිරීමටත් සභාව තීරණය කරන ලදී.**

**3:5** " නගර ශාලාව නොමිලේ ලබා ගැනීම " මැයෙන් 2013. 04. 26 දාතමින් ඕ ඒ. පියසීලි මිය විසින් එවන ලද ලිපිය සභාගත කරන ලදී.

2013- 05- 04 දින පැවැත්වෙන භාවනා වැඩ සටහනක් සඳහා නගර ශාලාව නොමිලේ ලබා දීමට කටයුතු කරන මෙන් ඉල්ලීම් කර තිබුණි.

<u>තීරණය</u>

☛ **2013- 05- 04 දින භාවනා වැඩ සටහනක් සඳහා විදුලිය හා ජලය සඳහා පමණක් ගාස්තු අය කර නගර ශාලාව නොමිලයේ ලබා දීමට සභා අනුමැතියට යටත්ව අවසර ලබා දීම වෙනුවෙන් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**(04)** යථා පරිදි කල්දී ඇති ප්‍රශ්ණ නැත

**(05)** යථා පරිදි කල්දී ඇති යෝජනා නැත

## (06) කාරක සභා වාර්තා සලකා බැලීම

**6: 1** **2013- 05- 02** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද පුස්තකාල කමිටු වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

මෙම වාර්තාවෙහි පුස්තකාලය සඳහා අවශ්‍ය පරිගණක මෘදුකාංගයක් ගැනීම සඳහාත් ඊ ලයිබ්‍රරිය සඳහා මෘදුකාංගයක් ලබා ගැනීමටත් අනුමැතිය ඉල්ලා තිබෙනවා.

ඒ අනුව එම මෘදුකාංග ලබා ගැනීම සුදුසු යැයි ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව 2013 -05- 02 දින පවත්වන ලද පුස්තකාල කමිටු වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

**6: 2** **2013- 03-28** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද පොල්වත්තපුර නගර සභා නිවාසලාභීන් සඳහා ඔප්පු ලබා දීම පිළිබඳ කමිටු වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතක්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී.

අංක 241/17 , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචිව සිටින ගාල්ලගේ හදාවතී මහත්මියට ඔප්පු ලබා දීමට සුදුසු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

අංක 241/16 , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචි මාදුවගේ නන්දාවතී මහත්මියට ඔප්පු ලබා දීමට සුදුසු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

අංක 241/21 , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචි කටුවන ඒකනායක ගුණවතී මහත්මියට ඔප්පු ලබා දීමට සුදුසු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

අංක 241/20 , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචි තුයියලාගේ මහින්දදාස යන අයට ඔප්පු ලබා දීමට සුදුසු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

අංක 241/19 , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචි පොරවගමගේ රණසිරි යන අයට ඔප්පු ලබා දීමට සුදුසු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතක්‍රම මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

අංක 241/23 , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචි ක්‍රිස්තොම්බු ජයංගනී යන අයට ඔප්පු ලබා දීමට සුදුසු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතක්‍රම මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

අංක 241/22 , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචිව සිටින්නේ කුකුලගේ ජයසිරි සිල්වා යන අයට ඔප්පු ලබා දීමට සුදුසු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

අංක 241/01 , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචිව සිටින්නේ, ඩබ්. ටී. යසවතී මහත්මියට ඔප්පු ලබා දීමට සුදුසු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතක්‍රම මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

අංක 241/03 බී , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචිව සිටින මල්ලියාවඩු දිනේෂ් කුමාර යන අයට ඔප්පු ලබා දීම සම්බන්ධයෙන් නැවත කමිටුවක් රැස්කර ඔප්පු ලබා දීම සම්බන්ධයෙන් තීරණයක් ගැනීමට සභාව තීරණය කරන ලදී.

අංක 241/02 , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචිව සිටින පොරවගමගේ යසවතී යන අයට ඔප්පු ලබා දීම සම්බන්ධයෙන් නැවත කමිටුවක් රැස්කර ඔප්පු ලබා දීම සම්බන්ධයෙන් තීරණයක් ගැනීමට සභාව තීරණය කරන ලදී.

අංක 241/03 , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචි මල්ලියාවඩු සිසිර සමන්ත යන අයට ඔප්පු ලබා දීමට සුදුසු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.

අංක 241/05 , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචිව සිටින්නේ මල්ලියාවඩු සුසන්ත යන අයට ඔප්පු ලබා දීමට සුදුසු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.

241/07 , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචි එච්. එල්. සුගතදාස යන අයට ඔප්පු ලබා දීමට සුදුසු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.

අංක 241/09 , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචි ඒ.එච්. ජයවතී යන අයට ඔප්පු ලබා දීමට සුදුසු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතක්‍රම මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.

අංක 241/08 , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචිව සිටින්නේ ගාල්ලගේ ලලිත් ප්‍රේමලාල් යන අයට ඔප්පු ලබා දීමට සුදුසු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතක්‍රම මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.

අංක 241/03 , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචි ජුවන්වඩු සීලවතී යන අයට ඔප්පු ලබා දීමට සුදුසු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතක්‍රම මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.

අංක 241/11 , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචි ගාර්දිහේවා වසම් ගමගේ චන්ද්‍රජිත් යන අයට ඔප්පු ලබා දීමට සුදුසු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.

අංක 241/10 , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචි අලුත්වලහේවා පත්මපාල යන අයට ඔප්පු ලබා දීමට සුදුසු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.

අංක 241/14 , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචි පටබැඳිගේ යසරත්න යන අයට ඔප්පු ලබා දීමට සුදුසු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතක්‍රම මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.

**අංක 241/15 , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචි ගොන්සාලුවසම් ආරියවතී යන අයට ඔප්පු ලබා දීමට සුදුසු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**අංක 241/18 , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචි ගාල්ලගේ බන්දුවතී යන අයට ඔප්පු ලබා දීමට සුදුසු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතක්‍රම මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**අංක 241/06 , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචි හේවාගේ මැපියා පොන්සේකා යන අයට ඔප්පු ලබා දීමට සුදුසු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**අංක 241/04 , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචිව සිටින්නේ අලුත්වලහේවා ප්‍රේමවතී යන අයට සුදුසු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතක්‍රම මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**අංක 241/12 , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචි සල්පදෝරු තුප්පහි ප්‍රේමදාස යන අයට ඔප්පු ලබා දීමට සුදුසු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**අංක 241/09 , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචිව සිටින්නේ අලුත්වලහේවා ජයවතී යන අයට සුදුසු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතක්‍රම මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා කථා කරමින්,</u>

සභාපතිතුමනි මාර්තු 11 අවසන් තීරනේ දෙනවයි කිව්ව කැටැන්තොට ක්‍රීඩා පිටියේ ඉඩම් ප්‍රශ්නයට. ඒකට මොකද වුනේ. ඒ අයට වෙන තැනක් ලබා දෙනවද. මේකට මොකක් හරි කරන්න ඕනෙ කීඩා පිටිය ලොකු කරගන්න.

**ඒ අනුව 2013 -03-28 දින පවත්වන ලද පොල්වත්තපුර නගර සභා නිවාසලාභීන් සඳහා ඔප්පු ලබා දීම පිළිබඳ කමිටු වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

**6: 2** **2013- 03- 12** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද ස්වයංරැකියාලාභීන්ට නගර සභා සීමාව තුල ස්ථාන ලබා දීම පිළිබඳව කමිටු වාර්තාව නැවත ඉදිරිපත් කරන බවට ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා විසින් ස්ථිර කරන ලදී.

.

**6: 3** **2013- 03-28** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද පොල්වත්තපුර නගර සභා නිවාසලාභීන් සඳහා ඔප්පු ලබා දීම පිළිබඳ කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතක්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී.

**<u>ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

මේ වාර්තාවෙ එක් කරුණක් සම්බන්ධයෙන් මගේ විරුද්ධත්වය ප්‍රකාශ කරනවා. එකෙ තියෙන්නෙ දේශීය ණය සංවර්ධන අරමුදලෙන් ලබා ගත් ණය වල හිඟ වාරික ගෙවීම සම්බන්ධයෙන් මුද්දර ආදායමෙන් 50% ක් යෙදවීම කියල. ලේකම්තුමා, අපි මුද්දර ආදායම විතරයි සංවර්ධන කටයුතු සඳහා යොදා ගන්නෙ. සියළු ආදායම් ඔබතුමාලට දීල තියෙනවා. ඒ නිසා මේකට විකල්ප ක්‍රම වේදයක් යොදා ගන්න.

**ඒ අනුව 2012 -06- 25 දින පවත්වන ලද කළමනාකරණ කමිටු වාර්තාව ඒකමතිකව සහා සම්මත විය.**

**6: 4** **2012- 07- 24** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද සෞඛ්‍ය හා සනීපාරක්‍ෂක කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව 2012 -07- 24 දින පවත්වන ලද සෞඛ්‍ය හා සනීපාරක්‍ෂක කමිටු වාර්තාව ඒකමතිකව සහා සම්මත විය.**

## (07) ටෙන්ඩර් හා මිල ගණන්

<u>ටෙන්ඩර්</u> :-

**7:1:1** අම්බලන්ගොඩ නගර සභා ආපන ශාලාව 2012 – 09 – 15 සිට 2013 – 09 – 15 දක්වා වර්ෂයකට බදු දීම සඳහා ටෙන්ඩර් කරන ලදුව ඉදිරිපත් වී ඇති මිල ගණන අවම මිල ගණනට වඩා අඩු බැවින් නැවත ටෙන්ඩර් කිරීමට සභාව තීරණය කරන ලදී.

| අනු අංකය | ටෙන්ඩර්කරුගේ නම | ලිපිනය | අවම වාර ෂික බදු මුදල රු. | ඉල්ලුම් කල ටෙන්ඩර් මුදල රු. | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|
| 01 | K. T. දමිත් වජිර කුමාර | 22/1, පසද්කදාලෝක පටුමග, අම්බලන්ගොඩ | 60000.00 | 45000.00 | - |
| | | | | | |

**7:1:2** අම්බලන්ගොඩ නගර සභා නව මාළු වෙළඳ පොල ගබඩා කාමරය ටෙන්ඩර් කරන ලදුව ටෙන්ඩර් පත් ලැබී නොමැති බැවින් නැවත ටෙන්ඩර් කිරීමට සභාව තීරණය කරන ලදී.

| අනු අංකය | ටෙන්ඩර්කරුගේ නම | ලිපිනය | අවම මාසික කඩ කුලී මුදල රු. | ඉල්ලුම් කල ටෙන්ඩර් මුදල | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|
| 01 | - | - | 1750.00 | - | - |
| | | | | | |

<u>**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කථා කරමින්,**</u>

සභාපතිතුමනි කලින් ලක්ෂ 4 ට තක්සේරු කරපු කඩයක් දැන් ලක්ෂයකට තක්සේරු කරල තියෙනවා. ඒක මොකක්ද?

<u>**ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,**</u>

ඒක පරීක්ෂා කරල බලල වාර්තා කරන්න.

**7:1:3** අම්බලන්ගොඩ නගර සභා නව මාළු වෙළඳ පොල ගබඩා කාමරය ටෙන්ඩර් කරන ලදුව ටෙන්ඩර් පත් ලැබී නොමැති බැවින් නැවත ටෙන්ඩර් කිරීමට සභාව තීරණය කරන ලදී.

| අනු අංකය | ටෙන්ඩර්කරුගේ නම | ලිපිනය | අවම මාසික කඩ කුලී මුදල රු. | ඉල්ලුම් කල ටෙන්ඩර් මුදල | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|
| 01 | - | - | 1750.00 | - | - |
| | | | | | |

**7:1:4** අම්බලන්ගොඩ නගර සභා නව මාළු වෙළඳ සංකීර්ණය අංක 10 කාමරය ටෙන්ඩර් කරන ලදුව ටෙන්ඩර් පත් ලැබී නොමැති බැවින් නැවත ටෙන්ඩර් කිරීමට සභාව තීරණය කරන ලදී.

| අනු අංකය | ටෙන්ඩර්කරුගේ නම | ලිපිනය | අවම මාසික කඩ කුලී මුදල රු. | ඉල්ලුම් කල ටෙන්ඩර් මුදල | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|
| 01 | - | - | 1000.00 | - | - |
| | | | | | |

## 7:2 මිල ගණන් :-

**7:2:1** Box File මිලදී ගැනීම සඳහා මිළ ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරිගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනීමට සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | රෝයල් පොත්හල | චාමර බුක් ෂොප් | සීතා ස්ටෝර්ස් |
|---|---|---|---|---|---|
| 01 | Box file (Plastic) | 20 | 250/- | - | 225/- |
| 02 | Box file (Normal) | - | 190/- | 185/- | 200/- |
| 03 | Box file (Magazine Holder) | - | 195/- | - | - |

**7:2:2** ගබඩා භාණ්ඩ මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරිගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනීමට සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | ඒ.පී.පී. මෙන්ඩිස් | ඉඳුනිල් හාඩ්වෙයාර් | බී.කේ.එස්.කම්පැනි |
|---|---|---|---|---|---|
| 01 | හුණු | 500 kg | 1kg 25/- | 21/2kg 100/- | 8kg 175/- |
| 02 | නිල් | 1 kg | - | 400/- | 200/- |
| 03 | පින්සල් | 04 | 50/- | 85/- | 85/- |

**7:2:3** තරාදි (Budry) සඳහා මිල ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරිගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිළ ගණන් පිලිගැනීමට සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | ජෙනරල් ස්ටෝර්ස් | ඉඳුනිල් හාඩ්වෙයාර් | බී.කේ.එස්.පුද් සමාගම |
|---|---|---|---|---|---|
| 01 | තරාදි Budry- 100kg<br>Max - 100kg<br>Min - 5kg<br>Model - 987f | 03 | 4650/- | නැත | 4400/- |

**7:2:4** සහතිකපත් මුද්‍රණය සඳහා මිල ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරිගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනීමට සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | ඩී.ආර්.එස්. ප්‍රින්ටර්ස් | සක්වා ප්‍රින්ටර්ස් | ආරියදාස ප්‍රින්ටර්ස් |
|---|---|---|---|---|---|
| 01 | සහතික පත්‍ර (දෙන ලද ආකෘතිය | 885 | 19.50 | 15.75 | 17.00 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | අනුව වර්ණ හතර) | | | | |
| | වර්ණ දෙක | 885 | 13.90 | 11.00 | 14.50 |

**7:2:5** ගබඩා ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරිගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනීමට සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | **Nelco Steels** | **Araliya Steel** | **Jai Enterprises** | **Arovel Steels** |
|---|---|---|---|---|---|---|
| 01 | 1 ½" ø (H/D) GI පයිප්ප | 32 | 5400.00 | 5250.00 | 5500.00 | 5400.00 |
| 02 | 48.6 ප්‍රමාණයේ ජොයිස් | 50 | 215.00 | 200.00 | 225.00 | 210.00 |
| 03 | 1 " ø (H/D) GI පයිප්ප | 03 | 3850.00 | 3750.00 | 3900.00 | 3850.00 |
| 04 | ¾ " ø (H/D) GI පයිප්ප | 15 | 2600.00 | 2500.00 | 2850.00 | 2650.00 |
| 05 | 4'-0'' ග්‍රීන් නෙට් (15m) | රෝල් 4 | 11000.00 | 10500.00 | 10750.00 | 11000.00 |
| 06 | ½'' X ¼ '' පට්ටම් (18'-0'') | 30 | 495.00 | 475.00 | 490.00 | 485.00` |

**7:2:6** වානේ කබඩ් හා ලිපිගොනු කැබිනට් මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරිගේ නිර්දේශය මත ලැබී ඇති මිල ගණන් අතරින් අවම මිලගණන් පිලිගැනීමට සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | ඩයමන් ෆර්නිචර් | කේ.එස්.ගුණවර්ධන සහ සමාගම | පත්මා ලිබඩු |
|---|---|---|---|---|---|
| 01 | ලාච්චු 3 සහිත වානේ කබඩ් | 02 | දම්රෝ 10850/- | එවරෝ 10958/- | එවරෝ 11950/- |
| 02 | 6'X3'ප්‍රමාණයේ ලිපිගොනු කැබිනට් | | දම්රෝ 11900/- | එවරෝ 15798/- | පියෙස්ට්‍රා 9900/- |

**7:2:7** පදක්කම් මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරිගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනීමට සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | සුමන ග්‍රැෆික්ස් | සමාරා ග්‍රැෆික්ස් | ටිරෝන් මල්ටි ක්‍රාෆ්ට් |
|---|---|---|---|---|---|
| 01 | රන් පදක්කම් (G20) | 261 | 180.00 | 160.00 | 170.00 |
| 02 | රිදී පදක්කම් (G20) | 261 | 180.00 | 160.00 | 170.00 |
| 03 | ලෝකඩ පදක්කම් (G20) | 261 | 180.00 | 160.00 | 165.00 |

**(08)** ගෙවීම්

8\. 1 ඇ. අංක 197 යටතේ කාර්යාලයට ලබා ගන්නා ලද පහත සඳහන් කාර්යාලීය උපකරණ වනුවෙන් මාතර, කැකුණදුර, කේ. එස්. ගුණවර්ධන කම්පැනි (පුද්) සමාගම වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි, රු. 49300/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| 1) 4' X 2' ප්‍රමාණයේ ලාච්චු 02 සහිත මේස | 7825/- X 4 | - | 31300.00 |
| 2) ඇඳි සහිත යතුරුලියන පුටු | 4500/- X 4 | - | 18000.00 |
| | | | 49300.00 |

8.2 ඇ. අංක 208 යටතේ ගබඩාවට ලබා ගන්නා ලද CSS- 1 (200 L) කෝලාස් බැරල් 10 ක් වෙනුවෙන් කොළඹ 02, යුනියන් පෙදෙස, නො. 297A/1/1 හි ලංකෙම් සිලෝන් සමාගම වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 207200/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී. (රු. 18500/- X 10 + Vat)

8.3 ඇ. අංක 210 යටතේ ගබඩාවට ලබා ගන්නා ලද නව 37.5kg LP ගෑස් සිලින්ඩර් දෙකක (ගෑස් සමග) මිලදී ගැනීම වෙනුවෙන් අම්බලන්ගොඩ, පළමු හරස් වීදිය හි එම්. පී. ද සිල්වා මහතාට ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 27580/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී. (රු. 13790/- X 2)

| | | |
|---|---|---|
| නව ගෑස් සිලින්ඩරයක මිල | - | 6550.00 |
| ගෑස් සඳහා | - | 7240.00 |
| | | 13790.00 |

8\. 4 ඇ. අංක 209 යටතේ ගබඩාවට ලබා ගන්නා ලද නව 37.5kg LP ගෑස් සිලින්ඩර් අටක් (ගෑස් සමග) මිලදී ගැනීම වෙනුවෙන් අම්බලන්ගොඩ, පළමු හරස් වීදිය හි එම්. පී. ද සිල්වා මහතාට ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 57920/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී. (රු. 7240/- X 8)

8.5 ඇ. අංක 214 යටතේ පටබැඳිමුල්ල දෙවන හරස් මාර්ගයේ කාණුව ඉදිකිරීමට ලබා ගන්නා ලද 10mm ϕ සංස්ථා කම්බි 70 ක් වෙනුවෙන් අම්බලන්ගොඩ, මහා වීදිය, බී. කේ. එස්. කම්පැනි පුද් සමාගම වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 36750/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී. (රු. 525/- X 70)

8.6 ඇ. අංක 0888 යටතේ ගබඩාවට ලබා ගන්නා ලද කොම්පෝස්ට් බැරල් 300 ක් වෙනුවෙන් 10% රැඳවුම් ගාස්තු අම්බලන්ගොඩ, කුලීගොඩ, දිඹුල්දූව රන්මුතු සුජිත් වසන්ත මහතාට ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 82500/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.7 ඇ. අංක 218 යටතේ ලබා ගන්නා ලද Traffic Corns 100 ක් වෙනුවෙන් ලේකම්ගේ නිර්දේශය පරිදි මහරගම, නාවින්න, හයිලෙවල් පාර, නො 310 නාවින්න සුපර සෙන්ටර් හි ව්ඩ් පීරිස් ඩිස්ට්‍රිබියුටර්ස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 144000/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී. (රු. 1440/- X 100)

8.8 ඇ. අංක 179, 164 යටතේ ගබඩාවට ලබා ගන්නා ලද පහත සඳහන් ගල් වෙනුවෙන් ලේකම්ගේ නිර්දේශය පරිදි අම්බලන්ගොඩ, තිලකපුර, දයාරත්න ගල්මෝල හි කාන්ති බටුවංගල මිය වෙත රු. 24200/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| ABC කියුබ් | 5200.00 X 1 | - | 5200.00 |
| 1 ½'' ගල් | 4500.00 X 1 | - | 4500.00 |
| 3/4''ගල් | 4500.00 X 2 | - | 9000.00 |
| 1/4''ගල් | 5500.00 X 1 | - | 5500.00 |
| | | | 24200 .00 |

8.9 ඇ. අංක 142 හා 143 යටතේ ගබඩාවට ලබා ගන්නා ලද පරිගණක යන්ත්‍ර 02 ක් වනුවෙන් අම්බලන්ගොඩ, ගාලු පාර, නො. 249/1 හි ෆියුලිප් කම්පියුටර්ස් ආයතනය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි, රු. 94200/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී. (මෙම ඇණවුම යටතේ පරිගණක යන්ත්‍ර 6 ක් සඳහා මුදල් ගෙවා ඇත)

8.10 ඇ. අංක 0187 යටතේ ගබඩාවට ලබා ගන්නා ලද වාහන සර්විස් කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය වෙනුවෙන් ලේකම්ගේ නිර්දේශය පරිදි, අම්බලන්ගොඩ, සී/ස සමුපකාර විවිධ සේවා සමුපකාර සමිතිය වෙත රු. 14310/- ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| MP 90 – G Oil | 2385/- X 6<br>(5L) | = | 14310/-<br>(30L) |

8.11 බලංගොඩ නගර සභාවේ අධ්‍යයන චාරිකාව සඳහා යොදා ගන්නා ලද වාහනය වෙනුවෙන් රු. 24000/- ක් ලේකම්ගේ නිර්දේශය පරිදි අම්බලන්ගොඩ, පටබැඳිමුල්ල, චන්ද්‍රවාස පාර නො. 371/15 හි පී. එච්. වසන්ත ප්‍රේම මහතාට ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.12 ඇ. අංක 215 යටතේ ගබඩාවට ලබා ගන්නා ලද DS – 40 (Servo) ලීටර 210 ක් වෙනුවෙන් ලේකම්ගේ නිර්දේශය පරිදි අම්බලන්ගොඩ, සී/ස වි. සේ. ස. සමිතිය වෙත රු. 81980.00 ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.13 නගර සභාව සතු GL-9369 අංක දරණ ගලි බවුසරය සඳහා 2012 ජුනි මස 01-15 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 17170.00 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර |
|---|---|---|
| 3225 | ඩීසල් | 140 |
| | Engine Oil | 02 |

8.14 නගර සභාව සතු RA-8796 අංක දරණ ට්‍රැක්ටරය සඳහා 2012 ජුනි මස 01-15 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 13349.40 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 3206 | ඩීසල් | 32 |
| 3216 | ඩීසල් | 38 |
| 3228 | ඩීසල් | 44 |

8.15 නගර සභාව සතු RA-3709 අංක දරණ ට්‍රැක්ටරය සඳහා 2012 ජුනි මස 01-15 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 12954.40 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමූපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 3209 | ඩීසල් | 32 |
| | Engine Oil | 02 |
| 3217 | ඩීසල් | 27 |
| 3229 | ඩීසල් | 42 |

8.16 නගර සභාව සතු මාර්ග තලනය සඳහා 2012 ජුනි මස 01-15 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 10539.00 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමූපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 3212 | ඩීසල් | 60 |
| 3218 | ඩීසල් | 30 |

8.17 නගර සභාව සතු LF- 1853 අංක දරණ ටිපර් රථය සඳහා 2012 ජුනි මස 01-15 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 15808.50 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමූපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 3205 | ඩීසල් | 67 |
| 3222 | ඩීසල් | 68 |

8.18 නගර සභාව සතු LF- 1853 අංක දරණ ටිපර් රථය සඳහා 2012 ජුනි මස 15-30 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 11241.60 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමූපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 3232 | ඩීසල් | 73 |
| 3245 | ඩීසල් | 23 |

8.19 නගර සභාව සතු RA-3709 අංක දරණ ට්‍රැක්ටරය සඳහා 2012 ජුනි මස 15-30 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 13218.30 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 3234 | DS-30 Engine Oil | 06 |
| 3217 | ඩීසල් | 43 |
| 3229 | ඩීසල් | 50 |

8.20 නගර සභාව සතු 49-9421 අංක දරණ ට්‍රැක්ටරය සඳහා 2012 ජුනි මස 15- 30 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 10187.70 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 3239 | ඩීසල් | 38 |
| 3254 | ඩීසල් | 49 |

8.21 නගර සභාව සතු GL-9369 අංක දරණ ගලි බවුසරය සඳහා 2012 ජුනි මස 15-31 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 16394.00 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 3250 | ඩීසල් | 140 |

8.22 නගර සභාව සතු 49-9421 අංක දරණ ට්‍රැක්ටරය සඳහා 2012 ජුනි මස 01- 15 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 13854.50 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 3207 | ඩීසල් | 31 |
| | Engine Oil | 01 |
| 3215 | ඩීසල් | 39 |
| 3227 | ඩීසල් | 45 |

8:23 2012 ජූලි මාසය තුළ මැයි මාසයට අදාල ජල බිල්පත් සඳහා ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයට ගෙවීම්

| වැය අංකය | ගෙවූ මුදල |
|---|---|
| 11453 II | 12,417.44 |
| 23453 II | 12,311.56 |
| 34453 II | 929.60 |
| 52453 II | 49,105.30 |
| 62453 II | 11,429.34 |
| | 86,193.24 |

ජල බිල්පත් සඳහා රු. **86,193.24** ක මුදලක් චෙක්පතකින් ලේකම් නිර්දේශයෙන් ගෙවීම.

8:24 2012 ජුලි මාසය තුළ මැයි මාසයට අදාල විදුලි බිල්පත් සඳහා සී/ස ලංකා විදුලි (පෞද්ගලික) සමාගමට ගෙවීම.

| වැය අංකය | ගෙවූ මුදල |
|---|---|
| 53454 | 18,603.20 |
| 52453 I | 34,801.06 |
| 62453 I | 18,281.90 |
| 34453 I | 3,673.13 |
| 23453 I | 1,402.50 |
| 11453 I | 37,252.39 |
| | 114,014.18 |

විදුලි බිලපත සඳහා රු: **114,014.18** ක මුදලක් චෙක්පතකින් ලේකම් නිරදේශයෙන ගෙවීම.

8:25 2012 ජුලි මාසය තුළ ජුනි මාසයට අදාල දුරකතන බිලපත සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට හා ඩයලොග් ආයතනයට ගෙවීම.

| වැය අංකය | ගෙවූ මුදල |
|---|---|
| 11452 | 22,255.70 |
| 12452 | 1,163.28 |
| 25451 II | 3,808.01 |
| 62452 I | 1,386. 62 |
| | 28,613.61 |

දුරකතන බිලපත සඳහා රු: **28,613,61** ක මුදලක් චෙක්පතකින් ලේකම් නිරදේශයෙන ගෙවීම.

8.26 2012 - II කාර්තුව සඳහා ජාතිය ගොඩනැගීමේ බදු ලෙස රු. 17526.00 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.27 2012 - II කාර්තුව සඳහා මුද්දර බදු ලෙස ගෙවිය යුතු රු. 38563.67 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.28 දෙමහල් සාප්පු සංකීර්ණය සඳහා 2003 වර්ෂයේ හැර 2002 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා හිඟ ණය වාරික හා පොළී මුදල් හිඟ හිට ඇති අතර එම මුළු ණය මදල වන රු. 431951.85 ක මුදලක් ගණකාධිකාරී හා ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.29 2012 - II වන කාර්තුව VAT මුදල ලෙස රු. 170775.00 ක මුදල ලේකම්ගේ නිර්දේශය මත දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.30 පීරිස් වෙද මාවත ප්‍රතිසංස්කරණය කිරීම සඳහා J.C.B. යන්ත්‍රයක් ලබා ගැනීම වෙනුවෙන් රු. 16200/- ක මුදලක් පොල්වත්ත, නුගේතුඩුව පාර, 3/4 හි වයි. එච්. ටී. වික්‍රමසිංහ මහතාට ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.31 කොළඹ අභියාචනාධිකරණ නඩු අංක CA/PHC/248/2004 දරණ නඩුවේ නීතීඥ ගාස්තු රු. 30000/- ක මුදලක් නාලිනී අරුමප්පෙරුම මහත්මියට ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.32 ඕකන්ද නිවාස යෝජනා ක්‍රමයේ පළමු හරස් පාර කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තයේ රැඳවුම් මුදල වන රු. 5326.09 ක මුදල ලේකම්ගේ හා වැඩ අධිකාරීගේ නිර්දේශය මත සභාපති, ඕකන්ද ග්‍රාමීය සමෘද්ධි සංවර්ධන සමිතිය වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.33 පෝරඹ වලව්වත්ත පාර ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තයේ අවසාන ගෙවීම වන රු. 743253.57 ක මුදල ලේකම්ගේ හා වැඩ අධිකාරීගේ නිර්දේශය මත ආර්. ඊ. ද සිල්වා මාවත, කුඩා ගම්මාන සමිතිය වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.34 නුගේතුඩුව පාර නුගේතුඩුව හරස් පාර කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තයේ අවසාන ගෙවීම වන රු. 792874.30 ක මුදල ලේකම්ගේ හා වැඩ අධිකාරීගේ නිර්දේශය මත ආර්. ඊ. ද සිල්වා මාවත, කුඩා ගම්මාන සමිතිය වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.35 ආර්. ඊ. ද සිල්වා මාවත කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තයේ අවසාන ගෙවීම වන රු. 259839.25 ක මුදල ලේකම්ගේ හා වැඩ අධිකාරීගේ නිර්දේශය මත ආර්. ඊ. ද සිල්වා මාවත, කුඩා ගම්මාන සමිතිය වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.36 තල්ගස්ගොඩ විස්කම් පෙදෙස අභ්‍යන්තර මාර්ග තාර දැමීමේ කර්මාන්තයේ අත රැඳවුම් මුදල වන රු. 186126.51 ක මුදල ලේකම්ගේ හා වැඩ අධිකාරීගේ නිර්දේශය මත තල්ගස්ගොඩ, එකමුතු ග්‍රාමිය සමෘද්ධි බලකායේ සභාපති වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.37 2012 ජූලි මස NBT මුදල ලෙස රු. 18000.00 ක මුදල ලේකම්ගේ නිර්දේශය මත දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.38 ආපන ශාලාව බදු දීමට අදාල ප්‍රසම්පාදන දැන්වීම 2012-07-23 දින දිනමිණ පුවත්පතේ පල කිරීම වෙනුවෙන් රු. 20160.00 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය මත ශ්‍රී ලංකා ප්‍රවෘත්ති පත්‍ර සමාගම වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

## (09) ගිණුම්

**9:1** 2012 ජුනි මාසයේ වියදම් වාර්තාව, වියදම් වැය විශ්ලේෂණය - පොදු ගිණුම, මුදල් සාරාංශය හා ලැබීම් විග්‍රහය සභාවට ඉදිරිපත් කරන ලදී.

ඒ අනුව 2012 ජුනි මස ගිණුම් වාර්තා පිළිගතයුතු බව ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතාගේ හා ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය.

🍽 පෙ. ව. 12.20 ට තේ විවේකය සඳහා සභාවේ වැඩ කටයුතු නතර කරන ලදී.

🍽 පෙ. ව. 12.30 ට තේ විවේකයෙන් පසුව නැවත සභාව ආරම්භ කරන ලදී.

## (10) ඇස්තමේන්තු

**10.1** පී. එච්. ආර්. සුමනදාස මාවතේ සිට වතුර ටැංකිය දක්වා මාර්ගය අළුත්වැඩියා කිරීම සඳහා වැඩ අධිකාරී විසින් සකස් කරන ලද රු. 221839.05 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>තීරණය</u>

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10.2** නුගේතුඩුව පාර සහ නුගේතුඩුව හරස් පාර කොන්ක්‍රීට් කිරීම සඳහා (අතිරේක) වැඩ අධිකාරී විසින් සකස් කරන ලද රු. 48743.89 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>තීරණය</u>

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10.3** පෝරඹ වලව්වත්ත පාර ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම සඳහා (අතිරේක) වැඩ අධිකාරී විසින් සකස් කරන ලද රු. 21379.68 ක් වූ නව ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**තීරණය**

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10.4** පොල්වත්ත රංගපීඨය හා පුස්තකාලය අළුත්වැඩියා කිරීම සහ පින්තාරු කිරීම සඳහා වැඩ අධිකාරී විසින් සකස් කරන ලද රු. 213890.40 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**තීරණය**

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10.5:1** විහාරගොඩ නාන ළිඳ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වැඩ අධිකාරී විසින් සකස් කරන ලද රු. 11253.77 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**තීරණය**

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10.5:2** කළුවඩුමුල්ල නාන ළිඳ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වැඩ අධිකාරී විසින් සකස් කරන ලද රු. 80587.98 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**තීරණය**

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10.5:3** ඕකන්ද නාන ළිඳ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වැඩ අධිකාරී විසින් සකස් කරන ලද රු. 143017.27 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**තීරණය**

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10.6** හීන් ඇල පාර කාණු ඉදි කිරීම (2 අඩියර) සඳහා වැඩ අධිකාරී විසින් සකස් කරන ලද රු. 412528.00 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

සභාපතිතුමනි මේ කරන සියළුම කර්මාන්ත සඳහා අතිරේක ඇස්තමේන්තු ඉදිරිපත් කරනවා. නමුත් තල්ගස්ගොඩ ප්‍රදේශයේ දැනට අපි මාර්ග දෙකක් කරල තියෙනවා. තේවත්ත පාර සහ විස්කම් පෙදෙස මාර්ගය. මේවට අපි අතිරේක ඇස්තමේන්තු ඉදිරිපත් කරෙ නැහැ. තේවත්ත පාරෙ ඇස්තමේන්තු කරපු විදියට ගෙවල් තියෙන තැනට වඩා අඩි 100 කට මෙහායින් ඇස්තමේන්තුව නැවතුනා. නමුත් අපි ඒ අඩි 100 කරා. ඒවගේම විස්කම් පෙදෙස

මාර්ගයෙත් මීටර් 27 ක වැඩ අපි කරා. අතිරේක ඇස්තමේන්තු නොදා අදාල කර්මාන්තයෙන්ම මේ වැඩ කොටස් නිම කරා. මම සභාවේ දැනගැනීම සඳහා මෙය ප්‍රකාශ කලේ සභාපතිතුමනි.

<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

වැඩ අධිකාරීතුමා, සභාව දීපු මුදලට වඩා යම් කිසි වැඩ කොටසක් කරල තියෙනව නම් ඉදිරිපත් කරන්න. ප්‍රශංසා කිරීමේ යෝජනාවක් හරි ගේන්න ඕනෙ.

<u>තීරණය</u>

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10.7** පෝය සීමාව පාර කාණු කොන්ක්‍රීට් කිරීම සඳහා වැඩ අධිකාරී විසින් සකස් කරන ලද රු. 263584.58 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>තීරණය</u>

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10.8** පී. එච්. ආර්. සුමනදාස මාවත අතුරු මාර්ගය කොන්ක්‍රීට් කිරීම සඳහා වැඩ අධිකාරී විසින් සකස් කරන ලද රු. 1778968.84 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මේ ඇස්තමේන්තුව රාහුල මන්ත්‍රීතුමාගෙ ඉල්ලීම අනුව ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙත යොමු කරන්න.

<u>තීරණය</u>

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10.9** මුහුදු වෙරළ හරස් පාර චමින්ද පුෂ්පකුමාර මහතාගේ තාප්පය ඉදිකිරීම සඳහා වැඩ අධිකාරී විසින් සකස් කරන ලද රු. 33814.95 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>තීරණය</u>

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**(11)** වෙනත් කරුණු

**(12)** න්‍යාය පත්‍රයට ඇතුලත් නොවූ වෙනත් කරුණු

**12:1** ‘ නගර සභාව සතු පැරණි ගෘහස්ථ බැඩ්මින්ටන් ක්‍රීඩාගාරයේ වහල අළුත්වැඩියාව ’ මැයෙන් අම්බලන්ගොඩ බැඩ්මින්ටන් සංගමයේ ගරු ලේකම් විසින් ඉදිරිපත් කර තිබූ වාර්තාව සභාගත කරන ලදී.

අප සංගමයේ ඉල්ලීම පරිදි අළුත්වැඩියාව සඳහා වියදම් ඇස්තමේන්තුවක් එවීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වන බවත් ඒ වෙනුවෙන් වියදම් දැරීමට පරිත්‍යාගශීලියෙක් ඉදිරිපත් වී ඇති බවත් ඒ සඳහා අනුමැතිය ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කථා කරමින්,</u>

සභාපතිතුමනි කොන්දේසි සහිතව දෙන්න. ඒවගේම ඉවත් කරන දේවල් නගර සභාවට ගෙනල්ල දෙන්න කියන්න.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කථා කරමින්,</u>

සිසිර මහත්තය මේකෙ උඩ තියෙන ලීවල තත්වෙ බැලුවද? විසිලිම උඩින් ගිහිල්ල බැලුවද? දිරල නැතිව තියෙන ඒව ගලවන්න දෙන්න එපා.

<u>තීරණය</u>

☞ **නගර සභාවේ අධීක්ෂණය යටතේ මෙම කාර්ය සිදු කිරීමටත් ඉවත් කරන ද්‍රව්‍ය නැවත නගර සභාවට ගෙන ඒමටත් වන්දි නොඉල්ලීමේ ගිවිසුමක් අත්සන් කිරීමෙන් පසුව වැඩ කටයුතු ආරම්භ කිරීමටත් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:2** ‘ පළාත් මිල කමිටුව 2012 වර්ෂයේ දෙවන භාගය සඳහා මිල ගණන් ’ මැයෙන් පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා විසින් එවන ලද ලිපිය සභාගත කරන ලදී.

2012 වර්ෂයේ දෙවන භාගය සඳහා පළාත් පාලන මිල කමිටුව විසින් ඉදිරිපත් කර ඇති මිල ගණන් ඉදිරිපත් කර තිබුණි.

<u>තීරණය</u>

☞ **2012 වර්ෂයේ දෙවන භාගය සඳහා මිල ගණන් සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.**

**12:3** ‘ පෝරඹ වලව්වත්ත පාරට අනුබද්ධ පාර සභාවට පවරා දීම ’ මැයෙන් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

අංක 1411 දරණ මිනින්දෝරු ඩී. ජී. මෙන්ඩිස් මහතාගේ පිඹුරු සැලැස්මේ ඇති අඩි 10 පළල පාර සභාවට මායිම් ගතව ඇති 10’ – 0’’ පළලට අඩි 74’ – 0’’ ක් දිගට අම්බලන්ගොඩ නගර සභාවට පවරා ගැනීමට කැමැත්ත පල කර

ජී. එච්. ශ්‍යාමලී මිය, ජී. එච්. මාලතී සිල්වා මිය, එම්. එච්.බන්දුසීලි මිය, ජී. ඩබ්. හේමසිරි සහ කරුණාකලගේ සුනන්දාවතී යන අය විසින් අයදුම්පත් ඉදිරිපත් කර තිබුණි.

<u>තීරණය</u>

☞ **පෝරඹ වලව්වත්ත පාරට අනුබද්ධ පාර අඩි 10 පළල වන සේ නගර සභාවට පවරාගෙන සංවර්ධන කටයුතු කිරීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:4** ‘ 2012 ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා කොම්පෝස්ට් බඳුන් මිලදී ගැනීම ’ මැයෙන් ප්‍රාදේශීය පරිසර නිලධාරී, සංවර්ධන සහකාර, මහජන සෞඛ්‍ය පරීක්ෂක සහ කර්මාන්ත අධිකාරී විසින් ඉදිරිපත් කර තිබූ වාර්තාව සභාගත කරන ලදී.

කොම්පෝස්ට් බඳුන් මිලදී ගැනීම සඳහා මිළ ගණන් කැඳවීමේදී ප්‍රවාහනය රහිතව මීටියාගොඩ සංජය කොන්ක්‍රීට් වර්ක්ස් ආයතනයෙන් රු. 3200/- ක් ලෙසද, කුලීගොඩ රංමුතු කොන්ක්‍රීට් වර්ක්ස් ආයතනයෙන් රු. 2750/- ක් ලෙසද, මාතර ගැමි සුමිතුරෝ ආයතනයෙන් රු. 2970/- ක් ලෙසද, ප්‍රවාහනය සහිතව රු. 3525/- ක් ලෙසද මිළ ගණන් ලැබී තිබූ බවත් මීට පෙර අවස්ථාවේදී සංජය කොන්ක්‍රීට් වර්ක්ස් ආයතනයෙන් බැරල් ලබා ගත් අතර එහි ප්‍රමිතිය පිළිබඳව සෑහීමකට පත් නොවිය හැකි බවත් මාතර ගැමි සුමිතුරෝ ආයතනයේ බැරල් එම නිෂ්පාදන ආයතනයටම ගොස් අප විසින් පරීක්ෂා කර බැලූ බවත් එය ප්‍රමිතියෙන් ඉහල මට්ටමක පවතින බවත් එම ආයතනයෙන් ප්‍රවාහනය සහිතව බඳුනක් රු. 3525/- ක මුදලට මිලදී ගැනීම සුදුසු බව අප නිර්දේශ කරන බවත් දන්වා තිබුණි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි මුදලෙ වෙනස රු.750/- ක් විතර වෙනව. මේවගේ ප්‍රමිතිය කොහොමද කියල සාම්පල් එකක් ගෙන්නල බැලුවොත් හොඳයි නේද.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

මේව බලන්න නිලධාරීන් පත් කරල තියෙනවා. ඒ නිලධාරීන්ගෙ වගකීම තමයි මේක.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කථා කරමින්,</u>**

ගිය පාරත් නිලධාරීන් බලලනෙ ගෙනාවෙ. නමුත් ඒව කැඩුනා. මම අහන්නෙ මේකෙ මොනව හරි නිෂ්පාදනය කරන ක්‍රමය පිලිබඳ තොරතුරු තියෙනවද?

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

බැරල් එකේ ඡායාරූපයක් එක්ක විස්තර දක්වල තියෙනවා. වැඩ අධිකාරී මහත්මය මේක අපට ප්‍රවාහනය කරන්න බැරිද?

<u>තීරණය</u>

☞ **කොම්පෝස්ට් බඳුන් මිලදී ගැනීම සඳහා මාතර ගැමි සුමිතුරෝ ආයතනය තෝරා ගැනීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:5** **‘** භාණ්ඩාගාර බිල්පත් වල මුදල් ආයෝජනය කිරීම අනුමැතිය ලබා ගැනීම **’** මැයෙන් පොත් තබන නිලධාරිණිය විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සභාගත කරන ලදී.

035-1-001-4-6295638 අංක දරණ ගිණුමේ රු. 242345.78 ක් පවතින බවත් එය කුමන ආයතනයක කොපමණ කාලයකට ආයෝජනය කල යුතුද යන්න සඳහා උපදෙස් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **භාණ්ඩාගාර බිල්පත්වල මුදල් ආජෝජනය කිරීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:6** **‘** නොමිලයේ අභ්‍යාස පොත් ප්‍රදානය - 2012 **’** මැයෙන් ප්‍රජා සංවර්ධන නිලධාරී තුමිය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශයේ පාසල් දරු දැරියන් 1500 ක් සඳහා නොමිලේ අභ්‍යාස පොත් ප්‍රදානය කිරීම සඳහා රු. 1200000.00 ක් වූ ඇස්තමේන්තුව ඉදිරිපත් කර තිබුණි.

<u>තීරණය</u>

☞ **2013 වර්ෂය සඳහා නොමිලේ අභ්‍යාස පොත් ප්‍රධානය කිරීම සඳහා සහ ඊට අදාල ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**මෙම ඇස්තමේන්තුව ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**12:7** **‘**2012- ජූලි මාසික වාර්තාව **’** මැයෙන් ආයුර්වේද වෛද්‍යතුමිය විසින් ඉදිරිපත් කර තිබූ වාර්තාව සභාගත කරන ලදී.

ආයතනය විවෘතව තැබූ දින ගණන 18 ක් බවත් පැමිණි රෝගීන් සංඛ්‍යාව 284 ක් බවත් ඖෂධ සඳහා වැයවූ මුදල රු. 20744.00 ක් බවත් එක් රෝගියෙක් සඳහා වැයවූ මුදල රු. 73.00 ක් බවත් සඳහන් කර තිබුණි.

<u>තීරණය</u>

☞ **මෙම වාර්තාව සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.**

**12:8** ‘ රණවිරු ස්මාරකයක් ඉදිකිරීම සඳහා ස්ථානයක් ලබා ගැනීම සඳහා ’ මැයෙන් අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම්තුමා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

අම්බලන්ගොඩ - ගෝනාපීනුවල රණවිරු සංසදය මගින් රණවිරුවන් සිහිකිරීම සඳහා රණවිරු ස්මාරකයක් සෑදීම සඳහා හිරේවත්ත බුදු පිළිමය අසල භූමිය ලබා දීමට හැකියාවක් පවතින්නේ නම් එය ලබා දෙන ලෙස ඉල්ලා තිබුණි.

<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>

මේ සම්බන්ධයෙන් අපි වාර්තාවක් ලබා ගත්ත. මෙම ස්ථානයේ ගාලු පාරේ පළල අඩි 38 යි. මහා වීදියේ පළල අඩි 22 යි. මාර්ගය පුළුල් කිරීමේදී කොයි පැත්තෙන් කරත් මෙය කඩල යනවා.

<u>තීරණය</u>

☞ **රණවිරු ස්මාරකය ඉදි කිරීමට යෝජිත භූමිය මාර්ගය පුළුල් කිරීමේදී අදාල වන බැවින් ඒ බවද සැලකිල්ලට ගෙන කටයුතු කරන ලෙස දන්වා යැවීමට සභාව තීරණය කරන ලදී.**

**12:9** ‘ අම්බලන්ගොඩ, පටබැඳිමුල්ල, මුහුදු වෙරළ පාර අංක 16 ස්ථානයේ ’ ලිපිගොනුව සභාගත කරන ලදී.

බලපිටිය දිසා අධිකරණයේ ඉඩම් /2793 අංක දරණ නඩුවේ දේපළ සඳහා ප්‍රවේශ පහසුකම් ලබා ගැනීමට පටබැඳිමුල්ල නගර සභා ළිඳ පඩිය යම් ප්‍රමාණයක් ඉවත් කිරීම සඳහා ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගැනීමට යෝජනා කර තිබුණි.

<u>තීරණය</u>

☞ **මෙම ලිපිගොනුව නිවැරදි පරිපාලන යෝජනාවක් සමග ඊළඟ සභා වාරය සඳහා යොමු කිරීමට සභාව තීරණය කරන ලදී.**

**12:10** ‘ ගොඩනැගිල්ලට සංවර්ධන බලපත්‍රයක් ලබා ගැනීම මැයෙන් අම්බලන්ගොඩ, පනියන, හේමසීලී මල්ලියාවඩු මහත්මිය විසින් එවන ලද ලිපිය සහ ගොඩනැගිල්ලට සංවර්ධන බලපත්‍රයක් ලබා ගැනීම සඳහා ගරු සභාවේ අනුමැතිය ලබා ගැනීම ’ මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපි සභාගත කරන ලදී.

පිය උරුමයෙන් අයිතිව තිබුනු පර්චස් 23.2 ක ඉඩමට සහ ගොඩනැගිල්ලට 2012 වසර තෙක් වරිපනම් බදු ගෙවන අතර මෙම ගොඩනැගිල්ලට විදුලිය හා ජලයද ලබා ගෙන ඇති බවත් ශ්‍රී ලංකා ගුවන් හමුදා නිල සේවයේ යෙදී සිට ආබාධිත තත්වයට පත්වූ මාගේ වැඩිමහල් පුතු වන නිමන්ත දීපාල් වඩුතන්ත්‍රී යන අයට ජීවිකාව කරගෙන යාම සඳහා මෙම ඉඩමේ භුක්තිය පවරා ඇති බවත් මේ කරුණු ගැන සලකා බලා මෙම ගොඩනැගිල්ලේ සංවර්ධනය සඳහා බලපත්‍රයක් ලබා ගැනීම සඳහා ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලෙසත් හේමසීලී මල්ලියාවඩු මහත්මිය විසින් ඉල්ලා තිබුණි.

අනවසර ඉදිකිරීමක් සම්බන්ධයෙන් හේමසීලි මල්ලියාවඩු මහත්මියට විරුද්ධව බලපිටිය මහේස්ත්‍රාත් අධිකරණයේ අංක 38925 යටතේ නඩු පවරා ඇති අතර එකී නඩුවේ තීන්දුව අනුව කඩා ඉවත් කිරීමට තීන්දුව ලබා දී ඇති බවත් එකී තීන්දුවට විරුද්ධව ප්‍රතිශෝධන පෙත්සමක් මහාධිකරණයට යොමු කිරීමෙන් අනතුරුව මහේස්ත්‍රාත් අධිකරණයෙන් ලබා දුන් තීන්දුවට සනාථ කොට 2004-01-21 දින නියෝගයක් නිකුත් කොට ඇති බවත් එකී නඩු තීන්දුවට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කර ඇති අතර දෙවනි නඩු වාරය සඳහා 2012-09-20 දින කැඳවා ඇති අතර මෙම නඩුව අවසානයේ වාර්තාවක් සභාවට ඉදිරිපත් කල හැකි බව විෂය ලිපිකරු විසින් දන්වා තිබුණි.

<u>තීරණය</u>

☞ **මේ සම්බන්ධයෙන් අභියාචනාධිකරණයේ නඩුවක් පවතින බැවින් තීරණයක් ලබා නොදීමට සභාව තීරණය කරන ලදී.**

**12:11** ' කෙරමිණිය අතුරු මාර්ගය කොන්ක්‍රීට් කිරීම සඳහා වු වියදම් වර්තාව ' මැයෙන් තාක්ෂණ නිලධරීතුමිය විසින් එවා තිබු වර්තාව සභාගත කරන ලදී.

ගබඩාවෙන් ලබා ගත් ද්‍රව්‍ය වල වටිනාකම රු. 119857.50 ක් බවත් ප්‍රවාහන වියදම රු. 5750.00 ක් බවත් මෙම කර්මාන්තය සඳහා ඇස්තමේන්තු මුදල රු. 207904.40 ක් බවත් මෙම කර්මාන්තය ප්‍රදේශවාසීන්ගේ ශ්‍රම දායකත්වයෙන් ඉටුකල අතර සභාවෙන් වියදම් කල මුළු මුදල රු. 125607.50 ක් බවත් දන්වා තිබුණි.

<u>තීරණය</u>

☞ **මෙම ලිපිය සභාවි දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.**

**12:12** ' 2012 අය වැය ලේඛණය - වැය ශීර්ෂ අතර ප්‍රතිපාදන මාරු කිරීමට අනුමැතිය ලබා ගැනීම ' මැයෙන් පොත් තබන නිලධාරිණිය විසින් ඉදිරිපත් කර තිබු ලිපිය සභාගත කරන ලදී.

| **ප්‍රතිපාදන ඉක්මවා ඇති වියදම් වැය ශීර්ෂ පිළිබඳ විස්තර** | | | | | **ඌණ ප්‍රතිපාදන පියවා ගන්නා ආකාරය** | | |
|---|---|---|---|---|---|---|---|
| ශීර්ෂය | වැය විස්තරය | 2012 ඇස්තමේන්තුව | 2012/12/31 දිනට අපේක්ෂිත සත්‍ය වියදම | 2012/12/31 දිනට අපේක්ෂිත ඌනතාවය | ප්‍රතිපාදන මාරු කිරීමේ වැය ශීර්ෂය | ප්‍රතිපාදන මාරු කිරීමේ වැය ශීර්ෂයේ ඉතිරි ප්‍රතිපාදන | ප්‍රතිපාදන මාරු කිරීම |
| 34461(II) | ඉඩම් මිලදී ගැනීම් වන්දී පොළී | 50000.00 | 180000.00 | 130000.00 | 34416 | 234207.75 | 100000.00 |
| | | | | | 34419 | 198464.11 | 30000.00 |

<u>තීරණය</u>

☞ **වැය ශීර්ෂ අතර ප්‍රතිපාදන මාරු කිරීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:13** ' ස්ථාන මාරු කිරීම ' මැයෙන් දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්තුමා විසින් එවන ලද ලිපිය සභාගත කරන ලදී.

නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ සේවයේ නියුතු වෛද්‍යවරියට මරණීය තර්ජන හා එම ස්ථානයේ රාජකාරී කිරීමේ ගැටළු මතුවී ඇති බවත් ගරු ප්‍රධාන අමාත්‍යතුමා සහ ගරු නගරාධිපතිතුමා සමග සාකච්ඡාවේදී ගනු ලැබූ තීරණය අනුව නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාව දැනට හිස්ව පවතින අම්බලන්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයට ගෙන යාම සිදු කරන ලෙසත් මේ අනුව වෛද්‍ය නිලධාරිණියට ලබා දී ඇති ස්ථාන මාරුව අවලංගු කරන බවත් දන්වා තිබුණි.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

මේ ප්‍රශ්නය ඇති වුනේ ආයුර්වේදයට යාබද නිවසේ පදිංචි කාන්තාවන් දෙදෙනෙක් විසින් වරින් වර ආයුර්වේද වෛද්‍යවරියට අසභ්‍ය වචනයෙන් බැණ වැදීම සහ මරණීය තර්ජනය එල්ල කරල ප්‍රශ්න ඇති වුනා. එක් වතාවක් වෛද්‍යතුමිය විසින් පොලිසියට පැමිණිලි කරල මේ කාන්තාවන් දෙදෙන අධිකරණයට ඉදිරිපත් කරල තියෙනවා. ඊට පසුත් නිරන්තරයෙන් මේ කාන්තාවන් බැණ වදින බැවින් ස්ථාන මාරුවක් හෝ වෙනත් ස්ථානයකට ආයුර්වේදය රැගෙන යන ලෙසත් වෛද්‍යවරිය ඉල්ලා සිටියා. පළමු වර වෛද්‍ය වරිය පොලිසියට පැමිණිලි කරන්න ගියා. දෙවනි වර වෛද්‍යතුමිය පොලිසි යාම ප්‍රතික්ෂේප කරා. ඒ නිසා අපිට ඉදිරි පියවරක් ගන්න බැරි වුනා. මේ වෛද්‍ය වරිය මාරුවක් ඉල්ලුවහම මම ඒක නිර්දේශ කරල සෞඛ්‍ය අමාත්‍යාංශයට යැව්ව. මේ වෛද්‍යවරිය වෙනුවට දාල තිබුණ වෛද්‍යවරියත් මරණීය තර්ජන මත මාරුවීම සිදු කරන බැවින් මාරුවීම ප්‍රතික්ෂේප කරල තිබුණා. එනිසා ගරු ප්‍රධාන අමාත්‍යතුමා මා සමග දුරකථනයෙන් මේ ගැන සාකච්ඡා කරල ඉල්ලා සිටිය ආයුර්වේදය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයට ගෙන යන ලෙස. එම ඉල්ලීම අනුව මම ගරු සභාවෙ අනුමැතිය ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කථා කරමින්,</u>**

මම හිතන්නෙ සභාපතිතුමනි එතුමිය හරියට වැඩ කරන්න ගිහිල්ල වුන දෙයක් ඕක. දැන් එතුමිය පළවෙනි පැමිණිල්ලට පොලිසි ගියා. ඔය පොලිසි යද්දි ලේකම් තුමා සහයෝගයක් දෙන්නෙ නැද්ද? මට එහෙම ආරංචියක් ලැබුනා.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

අපේ නිලධාරීන් ඒ ස්ථානයට ගියා. නිලධාරීන්ට ඊට එහා ගියපු ක්‍රියාවක් කරන්න බැහැ. පොලිසියෙ සහාය පැතීමයි තියෙන්නෙ. දෙවනි වර වෛද්‍යතුමිය පොලිසියට ගියේ නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කථා කරමින්,</u>**

කෙසේ වෙතත් මට හිතෙන්නෙ දෙවනි වර මේක බැලුවෙ නැහැ කියලයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙ ඉල්ලීම ඉෂ්ට කරමු. රාජකාරී තත්වය සහ කෙරෙන්න ඕන ක්‍රියාපිලිවෙත මත ස්වාධීනව තමයි සභාවක් විදියට කටයුතු කරන්න ඕනෙ. මේ සිද්ධියේදී අදාල පාර්ශවයත් සභාවත් එක්ක අමනාප වුනා. එක්කො මුලින්ම මේ වගේ තීරණයක් ගන්න තිබුණ. පෞද්ගලිකවම මගේ ගෙදරට ඇවිල්ල මට දෝෂාරෝපණය කරා. මගේ ප්‍රදේශයේ නොවුනත් සභාවක් විදියට අපි සමස්ථ බල ප්‍රදේශයේ දේවල් වලටම වග කියන්න ඕනෙ. රජයේ සේවය

වුනහම අපි ඕනෑම දේකට මුහුණ දෙන්න ඕනෙ සභාපතිතුමනි. මේ දේවල් ගැනත් නිලධාරීන් දැනුවත් කරන්න කියා ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ. පී. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කථා කරමින්,</u>**

සභාපතිතුමනි මම මේ ගැන වචනයක් කිව යුතුයි. මම එකම දවසක් ගියා ආයුර්වේදයට. මම අවංකවම ගියේ මානුෂිකව හිතල. ඔය උඩ ගෙදර අය මට ඡන්දයක් දුන්නෙ නැහැ. ඒ අය පරම්පරාගත වාමාංශික අය. නමුත් දැන් මේ වෛද්‍යතුමිය මම ඒ අයට උදව් කරනව කියල මම අධිකරණයේ නඩුවට පෙනී සිටිය කියල මට දැඩි ලෙස දෝෂාරෝපණය කරනව. මම කරන්නෙ මගේ වෘත්තිය. ඒ වෛද්‍ය තුමිය එහෙම මට ඇඟිල්ල දික් කරන එක හරිම අසාධාරණයි සභාපතිතුමනි. එහෙම නඩුවක් තිබුනෙත් නැහැ. මම පෙනී සිටියෙත් නැහැ. මම ඒ වෛද්‍යවරියට අභියෝග කරනවා. මම කියන්නෙ ඔතන ඉන්න බැරි නම් ඒ වෛද්‍ය තුමියට අතෙන්ට ගිහිල්ලත් ඉන්න බැහැ. ඔය කියන ජනතාව අපේ ගෙදරට ඇවිල්ල බැන්න. කිත්සිරි මන්ත්‍රීතුමාගේ ගෙදරට ඇවිල්ල බැන්න. අපි ඒ පාර්ශවයෙන් බැනුම් ඇහුව කියල අපි නගර සභාවට එන එක නවත්තනවද? අපි මන්ත්‍රීකම අත ඇරල යනවද? අපි දෝෂාරෝපනයන් අහගෙන අපේ වැඩ කටයුතු කරගෙන ඉන්නව. ඇත්තටම වෛද්‍යවරියක් කියන්නෙ බොහොම ඉවසිලිවන්ත කාරුණික චරිතයක් වෙන්න ඕනෙ. එක පාර්ශවයක් බනින කොට මමත් බැන්නොත් තමයි ආරවුලක් ඇති වෙන්නෙ. මගේ ජීවිත කාලයටම ඔය නිදහස් ආයුර්වේදයට ගිහිල්ල තියෙන්නෙ එකම දවසයි. මට තේරෙනව දැන් ඒ ගිහිපු මට ඔය වගේ කතා කරන්න මේ වෛද්‍යතුමියට පුළුවන් නම් මට තේරෙනව මොකක්ද ඒකෙ පාරිසරික පැත්ත කියල. මහ ඇමතිතුමා කරල තියෙන ඉල්ලීමට මම විරුද්ධ වෙන්නෙ නැහැ. එතුමා අපේ සංවිධායක තුමා, පළාතේ ප්‍රධාන අමාත්‍යතුමා. නමුත් මම නගන ප්‍රශ්නය එතුමියට මෙතන ඉන්න බැරිනම් එම්. ඕ. එච්. එකට ගිහිල්ල එතනත් කවුරු හරි මොනව හරි කිව්වොත් කොහාටද යන්නෙ. හැමදාම තිබුනෙ නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාව ඔතන සභාපතිතුමා. අම්බලන්ගොඩ නගර වාසීන් වෙනුවට එක පුද්ගලයෙක් නිසා අපි ස්ථානය වෙනස් කරනවා. මේක හරිම ව්‍යාකූල තත්වයක් සභාපතිතුමනි. විශේෂයෙන්ම මට ඇඟිල්ල දික් කරන්න එපා කියල කියන්නම ඔනේ. මම එවට කැමති නැහැ. ඔබතුමා හරි මේව නවත්තල දෙන්න. නැත්තම් මම එතුමියට එන්තරවාසියක් එවනව මට කරන ලද අවමානය සම්බන්ධයෙන් සහ දෝෂාරෝපනය සම්බන්ධයෙන්. එතුමියල අද ඉඳල හෙට යවී. මේක අපේ ගම. අපිට ගමේ මිනිස්සු ඕනෙ. ඔවුන් තමයි අපිව මේ තැනට ගෙනල්ල තියෙන්නෙ. එක්කෙනෙකුගෙ අවශ්‍යතාවය වෙනුවෙන් මම කවදාවත් වැනෙන්නෙ නැහැ. එනිසා එතුමි යමට කරන මේ අභූත චෝදනාව වහාම නවත්වන ලෙස මම සභාපතිගෙන් ඉල්ලා සිටිනවා. ස්තුතියි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි මට දැනගන්න ලැබුනෙත් දෙවනි වර එතුමියට නගර සභාවෙන් සහයෝගයක් ලැබුනෙ නැහැ කියන එකයි. එම වෛද්‍යතුමිය බැනුම් අහන්නෙ අපේ නගරයේ මිනිස්සු නිසා. අපිට සේවය කරන්න ගිහිල්ලා.
එවගේම මේ ළඟදි බස් ස්ටෑන්ඩ් එකේ සමිතියකින් කොල වගයක් බෙදල. ආරක්ෂක නිලධාරියා එපා කියද්දිත් තමයි බෙදල තියෙන්නෙ. ඒ වෙලාවෙ බහින් බස් වීමක් වෙලා තියෙනවා. ඊට පස්සෙ සංගමේ කට්ටිය ගිහිල්ල පොලිසියේ පැමිණිල්ලක් දාල අපේ ආරක්ෂක නිලධාරියා රාජකාරියේ යෙදී සිටියදීම අරගෙන ගිහිල්ල තියෙනවා. උප සභාපති තුමා පොලිසියේ ස්ථානාධිපතිතුමාට කතා කරල කිව්ව. මෙහෙම කෙනෙක් ගෙනල්ල කියල. නමුත් හවස් වෙනකම්ම මේ නිලධාරියව එව්වෙ නැහැ සභාපතිතුමනි. ඒ වෙලාව ඇතුලත බස් නැවතුම් පොලේ මොනව හරි වුනානම් ඒ නිලධාරියා ඒකටත් වග කියන්න ඕනෙ. පොලිසියටත් අපේ අප්‍රසාදය පල කරනවා සභාපතිතුමනි. මම කියන්නෙ අපේ සේවකයන් සම්බන්ධයෙන් අපි මීට වඩා සොයා බැලිය යුතුයි.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කථා කරමින්,**

මම ජගත් කුමාර මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා මේ ප්‍රශ්නය සභාවට ඉදිරිපත් කිරීම සම්බන්ධව. අපි පාලක පක්ෂයවත් විපක්ෂයවත් මේ බස් ස්ටෑන්ඩ් එකේ එක ලීෆ්ලට් එකක් වත් බෙදන්නෙ නැහැ. නමුත් පස්ගිය දිනක ජනතා විමුක්ති පෙරමුණට සම්බන්ධ ශිෂ්‍ය සංගමයක් මෙතන ලීෆ්ලට් බෙදන කොට ඒ අවස්ථාවේ රාජකාරී කරපු නිලධාරීන් දෙදෙනා මෙය කරන්න එපයි කියල දිගින් දිගටම කියද්දි බහින්බස් වීමක් වෙලා ගුටි හුවරාමැවක් වෙලා තියෙනවා. නමුත් ආරක්ෂක අංශයේ අය එක්ක නෙමෙයි ගුටි හුවමාරුව වෙලා තියෙන්නෙ. මේ ආරක්ෂක නිලධාරීන් එක්ක නෙමෙයි ගුටි හුවමාරු වුනේ පිටස්තර අය සමග කියල අවට කඩ හිමියන් සහ සිද්ධිය දැකපු අය පවා කිව්ව කියල ලේකම් තුමා මාත් එක්ක කිව්වා. නමුත් මේ නිලධාරින් දවස් 3 ක් පොලිසියට අරගෙන ගියා. රාජකාරි කරන අවස්ථාවෙදිම. ඒ වෙලාවෙ සභාපතිතුමා හිටියෙ නැහැ. මම ලේකම් තුමාට උපදෙස් දුන්නා මේ සම්බන්ධව සොයා බලන්න. ඉතාමත් කනගාටුයි සභාපතිතුමනි ඔබතුමාටත් කියල තියෙන්නෙ ගහගෙන කියල. මේ නිලධාරියා හරියට රාජකාරී කරන නිලධාරියෙක්. මම හිතන්නෙ ඒ නිලධාරියා හෙට අනිද්ද වෙනකොට සේවයෙන් ඉවත් වෙනවා. හෙට වෙනකොට සභාවෙ වැඩ කරන නිලධාරයෙකුත් පොලිසියෙන් ඇවිල්ල අරගෙන යන්න පුළුවන්. එවගේ තත්වයක් අද සභාවෙ තියෙන්නෙ. මම ලේකම් තුමා ගැන ඇත්තටම කනගාටු වෙනවා. දවස් තුනක් ගිහිල්ල ගහගනිපු අය අල්ල ගත්තට පස්සෙ තමයි මේ නිලධාරියා නිදහස් කරේ. අපේ වැඩ කරන සේවකයන් ගැන මීට වඩා සැලකිලිමත් විය යුතුයි කියන මතයෙ තමයි සභාපතිතුමනි අපි ඉන්නෙ. එක දවසක් ගහපු පෝස්ටරයක් සභාපතිතුමා ගිහිල්ල ඉරල ඒ මිනිස්සුන්ගෙ පඩියෙන් කැපුව. අපි ඒ මිනිස්සුන්ගෙ පඩියෙනුත් කපනවා. රාජකාරි කරහම ඒ මන්සුසයා ගුටි කන්නත් ඕනෙ. පොලිසිත් යන්න ඕනෙ. මේක හරිම ගැටළුවක්. ලේකම් තුමා ඔබතුමා ආයතනයේ ප්‍රධානියා විදියට මීට වඩා සේවකයන් ගැන සොයා බලන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කථා කරමින්,**

මම මේක දකින්නෙ අම්බලන්ගොඩ නගර සභාව රිමාන්ඩ් කරපු විදියට. එම නිසා ඒ සම්බන්ධයෙන් දැඩි පියවරක් ගන්න කියල මම මේ සභාවට යෝජනාවක් ඉදිරිපත් කරනවා.

එම යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

**පෙ. ව. 1.30 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා සභා ගර්භයෙන් පිටව යන ලදී.**

**ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා කථා කරමින්,**

නගර සභාවෙ නිදහස් ආයුර්වේදය සම්බන්ධව පසුගිය කාලෙ ඉඳපු වෛද්‍යවරු අවමානයට ලක් කිරීමක් කරනව නෙමෙයි නොයෙකුත් ප්‍රශ්න තිබුන සැරින් සැරේ. වෙලාවට එන්නෙ නැහැ.වෙලාව ඉවර වෙනකම් ඉන්නෙ නැහැ. වෙනත් ස්ථාන වල වැඩ කරන්න යනවා. ඔය වගේ විශාල චෝදනා තිබුණ. ඇත්තවශයෙන්ම දැනු ආපු වෛද්‍යවරිය සම්බන්ධව එවැනි චෝදනා එන්නෙ නැහැ. ආයුර්වේදය සම්බන්ධයෙන් හොඳ ප්‍රතිචාර ලැබෙන අවස්ථාවක් මේක. බෙහෙත් තියෙනවා. හොඳ වෛද්‍යවරියක් ඉන්නවා. වැඩ කරනවා. අද වෙනකොට නගර සභාව විසින් දොරටුවක් ඇහිරීමක් සම්බන්ධයෙන් මේ වෛද්‍යතුමියත් එක්ක තමයි ඒ අසල්වාසීන් චෝදනා කරන්නෙ. ඔය විදියට ලේකම්තුමාට කවුරු හරි ඇවිල්ල දොස් කිව්වොත් නගර සභාවත් අරන් වෙන තැනකට යන්න වෙනවා. අපි නගර වැසියන්ට සේවය කරන්න තමයි ආයුර්වේදයක් දාල තියෙන්නෙ. හොඳ වෛවද්‍යවරියක් ඉන්දැද්දි ඒ අය මේ විදියට දෝෂාරෝපනය කරන්නෙ මොකද කියල අපි සොයා බලන්න ඕනෙ. පොලිසිය මගින් හෝ මේ බාධා කිරීම් කරන එක නවත්තන්නයි ඕනෙ. වෛද්‍ය ස්ථානය වෙන තැනකට

ගෙනිහිල්ල එතනත් ප්‍රශ්නයක් ආවොත් ආයෙත් ප්‍රශ්නයක්. මම දන්නව සරත් ශ්‍රීලාල් මහත්මය උප සභාපතිවරයා වශයෙන් ඉන්න කාලෙ කුණු ප්‍රශ්නයක් ආව. ඒ අවස්ථාවෙ සභාපතිව සිටි පී. එම්. එස්. ද සිල්වා මහතා පිටරටකට ගිහින් හිටියෙ. අවසානයේ මෙතුමාට සහයට මමත් ආව. ඒ අවස්ථාවෙ පොල්වත්ත ප්‍රදේශයේ කුණු ගෙනිහින් දාන්න ගිහිල්ල අවසානයේ ගැටුමක් තත්වෙකට ඇවිල්ල රියදුරු මහතාට පහර එල්ල කරල මෙතන එනකොට උද්ඝෝෂණයක්. මගේ ගම උනත් එදා මමත් ගත්තෙ සේවයන්ගෙ පැත්ත. අපි මන්ත්‍රීමණ්ඩලයම කටයුතු කරෙ ඒ විදියට. අපි නීතියෙන් ඒක විසඳගන්න කටයුතු කරා.

ඒ වගේම ආරක්ෂක නිලධාරියාගේ ප්‍රශ්නය. අද රජයේ සේවකයන් මෝල ගස් වලින් ගහල මරනවා. එවැනි තත්වයන් ඇති වෙන්න දෙන්න හොඳ නැහැ. අපි සේවකයන් වෙනුවෙන් මැදිහත් වෙන්න ඕනෙ. මේ ආයුර්වේදයේ ප්‍රශ්නෙට මීට වඩා අවධානය යොමු කරල එතුමියට සේවය කරන්න පුළුවන් පරිසරයක් හදල දීම මේ නගර සභාවෙ යුතුකමක් හා වගකීමක්. ඒ කටයුත්ත කරන්න කියන ඉල්ලීම මම කරනවා.

නගර සභාවේ ලේකම් ඩී. වී. සුනිල් මහතා විසින් සභාවට කරුණු ඉදිරිපත් කරන ලදී.

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කථා කරමින්,**</u>

මේක ප්‍රජාතාන්ත්‍රවාදී රටක්. මෙහෙම යනකොට මේ රට මෙවැනි ශිෂ්‍ය ව්‍යාපාර වලට යට වෙලාද ඉන්නෙ.

නගර සභාවේ ලේකම් ඩී. වී. සුනිල් මහතා විසින් නැවතත් සභාවට කරුණු ඉදිරිපත් කරන ලදී.

<u>**ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කථා කරමින්,**</u>

සභාපතිතුමනි අපේ නගර සභාවෙ තියෙන ක්‍රමවේදයට නැතිව කරන්න ගිය නිසානෙ ඔය තත්වෙ ඇතිවුනේ.

<u>**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,**</u>

මුලින්ම මට ඔය තත්වෙ දැනුම් දුන් වෙලාවෙ කිව්වෙ දෙපිරිසක් ගහගෙන මේගොල්ලොත් එතන හිටිය කියලයි. ඊට අමතරව මේ පැමිණිල්ලෙ තියෙනවා ටෙලිෆෝන් එකක් නැතිවීම සම්බන්ධයෙනුත්. මංකොල්ලකෑම තියෙන කොට පොලිසියට බැහැ ඕක සමථ කරන්න. අනිවාර්යයන්ම උසාවි දාන්න වෙනවා.

සභාවේ ඝෝෂාකාරී තත්වයක් ඇතිවිය.

<u>**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,**</u>

පොලිසියට සමාදාන කරන්න පුළුවන් පැමිණිලි තියෙනවා. බැරි එවත් තියෙනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කථා කරමින්,**</u>

සභාපතිතුමනි ඕන කෙනෙකුට පැමිණිලි දාන්න පුළුවන්. විමර්ශනයක් කරල මේක සත්‍යද නැද්ද කියන එක පෙන්විය යුතුයි. එහෙම නම් ඕන කෙනෙකුට ගෙදර ඉඳගෙනත් පැමිණිලි දාන්න පුළුවන්නෙ.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,**

මන්ත්‍රීතුමා දැනට ලංකාවෙ පොලිසියෙ නැති එක තමයි ඔය විමර්ශනය කරන එක. එනිසා චෝදනාව කරන එක්කෙනා හිරේ දානව.

**ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කථා කරමින්,**

සභාපතිතුමනි මේක මේ නගර සභාවෙ රාජකාරි කරන්න ගිහිල්ල වෙච්ච දෙයක්. නිකම්ම මිනිහෙකුට ගහන්න යන්නෑනෙ. යම් හේතු කාරණා තියෙනවා. පොලිසියේ කටයුතු හරියට සිදු වෙන්නෙ නැත්නම් තවත් ඉහල ආයතන තියෙනවනෙ අපට පැමිණිලි කරන්න. ඇයි ලේකම්තුමා එකට ගියේ නැත්තෙ.

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කථා කරමින්,**

නගර සභාව පැත්තෙන් කිසිම ක්‍රියාමාර්ගයක් අරගෙන නැහැනෙ. ගහගත්ත එක ගහගත්තමයි කියමුකො. රාජකාරියට බාධා කිරීම සම්බන්ධයෙන් මොකක්ද ගත්ත ක්‍රියාමාර්ගය. ඒ පුද්ගලයා අවංකව වැඩ කරන නිලධාරියෙක් මෙහෙම වුනහම ඉච්ඡාභංගත්වයට පත්වෙනවනෙ. මේ පිළිබඳව සුළු කොට තකන්න බැහැ සභාපතිතුමනි. හෙට මේ දේ අනිත් නිලධාරියටත් වෙනවනෙ මේ විදියට. මම කියන්නෙ මේ පිළිබඳව අපට අපක්ෂපාතී තීරණයක් ලබා දෙන්න කියන්න පොලිසියේ නිලධාරීන්ට කතා කරල. අපි සභාව දැඩි තීන්දුවකට යන්න කලින්. හරියට රාජකාරිය කරන කොට මිනිස්සු ඇඟට එනවා. මගේ ඇස් දෙකෙන් දැකල තියෙනව වාහනයක් ඇතුලට දාන කොටම මේ නිලධාරිය විසිල් එක පිඹිනවා. මෙවැනි තත්වයක් තුල මේක හරිම කණගාටුදායක කරුණක්.

**ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කථා කරමින්,**

ලේකම්තුමා ඔබතුමාට මේ ගැන ඉහලට යන්න බැරිනම් ඔබතුමාගෙ රාජකාරියත් වැඩක් නැහැනෙ. මෙතුමා උප සභාපතිතුමා හැටියට මෙතුමා කියන දේ ඔබතුමා අහන්න ඕනෙ. මේ නිලධාරියෙක් වෙනුවෙන් කතා කරන්නෙ. ඔබතුමාම කියනව පොලිසියේ සාධාරණයක් කෙරුනෙ නැහැ කියල. එහෙම නම් ඊළඟට යන්න තියෙන තැනට යන්න ඕනනේ. අපි කියන්නෙ එකයි.

සභාවේ ඝෝෂාකාරී තත්වයක් ඇතිවිය.

**ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කථා කරමින්,**

මේ විදියට බලන කොට ඇත්තටම ආරක්ෂක අංශයක් වැඩක් නැහැනෙ සභාපතිතුමා. සභාපතිතුමනි ඉහලින් ගන්න ඕන තීන්දුව මෙතුමට ගන්න බැරිනම් ඔබතුමා සොයල බලල ගන්න.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,**

මේ කරුණු දෙකේදි පළවෙනි කාරණාවෙදි වෛද්‍ය තුමිය අවශ්‍ය කටයුත්ත අවශ්‍ය විදියට කරේ නැහැ. පොලිසියේ පැමිණිල්ලක් දැම්මෙ නැහැ. දෙවනි කාරනේදී මට දවස් දෙකක් විතර යනතෙක් හරියට සිදුවූ දේ දැනගන්න ලැබුනෙ

නැහැ. මට ලැබුණු තොරතුරු අනුව පෙනුනෙ මේ අය පුද්ගලිකව ගහගත්ත වගේ තමයි. මේකෙදි ටෙලිෆෝන් එකක් නැති වෙලත් තියෙනවා. එවැනි අවස්ථාවකදි පොලිසියේ බලය ඉවරයි. අධිකරණයට පමණයි ඒක බේරන්න පුළුවන්. ඔය මට්ටමින් හරි බේරිලා තියෙන්නෙ ආයතන මට්ටමින් කතා කරපු නිසා හරි තමයි. තමන්ට රාජකාරියට බාධා කරා කියල මේ අය පැමිණිල්ලක් දාන්නත් ඕනෙ. ඒකත් වෙලා නැහැ. දැන් මේක සමථ වෙලා තියෙන්නෙ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කථා කරමින්,**</u>

වෛද්‍යතුමිය ගැන කතා කරන කොට මේ විදියට බනින්න හේතුව මොකක්ද? මේකත් නගර සභාව නිසා නේද වෙලා තියෙන්නෙ. ඒ මිනිස්සුත් එක්ක ගිහිල්ල කතා කරල ඕකට තීරණයක් ගන්න පුළුවන්.

<u>**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,**</u>

මම වෛද්‍යවරියටත් කිව්ව. ඔබ තුමියගෙ කාර්ය රෝගීන් සුවපත් කරන එකයි. රෝගීන් දැකල පලා යාම නෙමෙයි කියල. වෛද්‍යතුමියත් එක්ක රණ්ඩු වෙන්නෙ නගර සභාවෙ ක්‍රියාවලියක් හින්ද? එතනින් ඒ ගෙදරට යන්න තිබුණ කවුළුව වහල දැම්ම. නමුත් පාර හොදට තාර දාල හදල දීල තියෙනවා. මේ අය මීට පෙර ඉදන්ම අපිත් එක්ක ප්‍රශ්න ඇති කර ගෙන තියෙනවා. ළමා ක්‍රීඩාංගණයේ රෙදි වැනුවා. ඒකටත් පොලිසි ගෙනියන්න වුණා. ආයෙත් පාරක් අපි ඔය හදපු බැම්ම කැඩුවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කථා කරමින්,**</u>

එතන පොඩ්ඩක් අයිනෙන් යන්න ඉඩක් දුන්නනම් ඉවරයිනෙ සභාපතිතුමා.

<u>**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,**</u>

එහෙම අවශ්‍ය නැහැ. යන්න පුළුවන් හොද පාරක් තියෙනවනේ. ඕක අද ඊයෙ නෙමෙයි ජී. එම්. එස්. ද සිල්වා මහත්මයා ඉන්න කාලෙත් වහන්න ගියා. වහන්න දුන්නෙ නැහැ. දැන් ඒ ප්‍රශ්නෙ ඉවරයි. නගර සභාව ඔය පවුල වෙනුවෙන් දැනට ලක්ෂ 10 කට වැඩිය වියදම් කරල තියෙනවා. ඔතන ගේ ඇතුලෙන් වටෙන් එන කාණුව කැඩිල තිබුණෙ. ඒක හදල දුන්නා. ළමා ක්‍රීඩාංගනේ වටේටම රෙද් වනන නිසා ග්‍රීන් නෙට් එක ගැහුවා ඒකට ලක්ෂ 5 ක් විතර ගියා. දැන් මේ බැම්ම බැන්දා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කථා කරමින්,**</u>

සභාපතිතුමනි මම පොලිසියට යනකොට අපේ ආරක්ෂක අංශෙ නිලධාරි මහත්මය පළවෙනි දවසෙ උදේ හතේ ඉඳල හවස හතරත් පහුවෙනකම් පොලිසියේ හිටියා. දෙවනි දවසෙත් උදේ ඇවිල්ල රාජකාරියට වාර්තාකරල පොලිසි ඇවිල්ල ඉන්නවා. එදා රෑ අට වෙනකන් ඉඳල තියෙනවා. වැරදි කරපු කෙනා කොහේවත්. නීතිගරුකව සේවය කරපු කෙනා පොලිසිය තුල රස්තියාදු වෙනවා. මේක අරුම පුදුම කතාවක්. නීතිගරුක පුද්ගලයා නිතරම බැට කනවා.

ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,

අපේ සේවකයො සම්බන්ධව වන සිද්ධි වලදී මීට වඩා වැඩි අවධානයක් යොමු කරන්න කියල ඉල්ලා සිටිනවා. මට පළවෙනි අවස්ථාවෙදිම නිවැරදි දැනුම් දීම වුනේ නැහැ. මේ සියළු දේවල් වල දෙපැත්තටම යම් යම් කරුණු තියෙනවා. අපි හැම විටම අපේ සේවකයො කියල තීරණ ගන්න හොඳ නැහැ. දෙපැත්තටම ඇහුන්කම් දෙන්න ඕනෙ.

තීරණය

☞ **ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ ඉල්ලීම අනුව නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ ඉදිරිපස කාමර දෙකට ගෙන යාමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:14** ‘ වාහන නඩත්තු කටයුතු සඳහා දෛනිකව ගෙවනු ලබන දීමනාව වැඩිකර දෙන ලෙස ඉල්ලීම ’ මැයෙන් එස්. ප්‍රදීප් ක්‍රිෂාන්ත කුමාර මහතා විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

වාහන නඩත්තු කටයුතු සඳහා දැනට දෛනිකව ලබා දෙන දීමනාව රු. 150/- ක් බවත් එම මුදල වැඩි කර දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

තීරණය

☞ **එස්. ප්‍රදීප් ක්‍රිෂාන්ත කුමාර මහතාට වාහන නඩත්තු කටයුතු වෙනුවෙන් දිනකට ලබා දෙන රු. 150/- දීමනාව රු. 250/- දක්වා වැඩි කිරීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:15** ‘ දීපව්‍යාප්ත සය සාමාජික සැහැල්ලු පන්දු ක්‍රිකට් තරඟාවලිය - 2012 ’ මැයෙන් අම්බලන්ගොඩ නගර සභා නිලධාරීන්ගේ ක්‍රීඩා හා සුභ සාධක සංගමයේ ලේකම් විසින් එවන ලද ලිපිය සභාගත කරන ලදී.

මෙම තරඟාවලිය 2012 අගෝස්තු මස 18, 19 දෙදින නගර සභා ක්‍රීඩාංගණයේදී පැවැත්වෙන බවත් මෙම දිනයන්හි පැමිණ සහභාගී වන මෙන් ගරු සභාපතිතුමා, ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු නගර සභා මන්ත්‍රීවරුන්ට ආරාධනය කර තිබුණි.

තීරණය

☞ **මෙම ලිපිය සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.**

✪ වෙනත් කරුණු

ගරු නගර සභා මන්ත්‍රී ඒ. පී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කථා කරමින්,

සභාපතිතුමනි, මහ අම්බලන්ගොඩ පාරෙ යතින් මහතාගේ නිවස ඉදිරිපිටින් යන පාර ඔබ තුමා කරන්න බැහැම කිව්ව. ඇත්තටම කිත්සිරි මන්ත්‍රීතුමා තමයි ඔය පාර හැදුවෙ. අපි එතුමාට ස්තුතිවන්ත වෙනවා. මේ පාරෙ මගේ නිවසට අල්ලපු ඉඩමේ අය ජලය ලබා ගන්න නගර සබාවට සල්ලි බැඳල පාර පළුදු කරන්න අවසර ඉල්ලල තියෙනවා. මමත් මේ නගර සභාවට රු. 11194.25 ක් ගෙවල තමයි මම පාර පළුදු කිරීම කරල ජලය ලබා ගැනීම කරේ. ඒ 2010 වර්ෂයේ. නගර සභාවෙන් පාර පළුදු කරනවට සල්ලි ගන්නවා. නමුත් කවදාවත් ඒව හදන්නෙ නැහැ. මේ මගේ නිවසට එහා පැත්තෙ අය පාර පළුදු කරන්න අවසර අරගෙන බැකෝ එහෙකින් තමයි පාර කැඩුවේ. මම ඒ අවස්ථාවෙ රෝහල්ගත වෙලා හිටියේ. මේ සිද්ධියට ලේකම් මහත්මයා පොලිසි ගිහිල්ල අපේ වැඩ අධිකාරී මහත්මය රු 58000/- ක ඇස්තමේන්තුවක් දීල තියෙනවා. දැන් මේකට විකල්පයක් ලෙස ඒ අයට පාර හදාගන්න දෙනවා. එහෙම නම් සභාපතිතුමනි මේක රීතියක් විදියට යම් කෙනෙක්ගේ දෙයකින් අනිත් කෙනා බන්ධනය වෙනවා. මින් පසු නගර සභා බල ප්‍රදේශයේ ඕනෑම කෙනෙක් පොදු දේපලකට හානියක් කරයි නම් පොලිසි යන්න ඕනෙ නැහැ. නඩු දාන්න ඕනෙ නැහැ. ඒ අයගෙ ඔළුව අතගාල හදල දෙන්න කියල තමයි කියන්න වෙන්නෙ. ඒ අයට හදන්න කිව්වම වැඩ බලන්න යන්න වෙන්නෙත් අපේ වැඩ අධිකාරීතුමයි නිලධාරී මහත්තරුයි. ඒත් අපේ සල්ලි. ඔය වගේ දේවල් සභාවට දාන්නෙ නැතුව කොහොමද සභාපතිතුමා මේවගේ තීරණ ගන්නෙ. ඇයි අපෙන් අහන්නෙ නැතුව මේ වගේ තීරණ ගන්නෙ. මම මේ ගැන ඉහලට දැනුම් දුන්නා. අනික් කාරණය තමයි මගේ ගෙදරට ඇවිල්ල කියනව ඔබතුමිය තමයි මේක ලේකම්තුමාට කිව්වෙ කියලත් කියනවා. මම මේ කිසි දෙයක් දන්නෙ නැහැ. මම ලේකම්තුමාට ඒ වෙලාවෙම දුරකථනයෙන් කතා කරා. ලේකම් තුමා කියනව ඔබ තුමි යමට කිව්වෙ නැහැ. පොලිසි ගිය එක ඇත්ත කියලා. අපිට වෙලා තියෙන්නෙ මිනිස්සු නගර සභාවට හානි කරල අපිට ගෙවල් වල ඉන්න නැහැ ඇවිල්ල ඇඟිල්ල දික් කරන්නත් පටන් අරගෙන. ආයුර්වේදයේ වෛද්‍යවරිය මට ඇඟිල්ල දික් කරනවා මම කිසි දෙයක් දන්නෙ නැහැ. මේවට ඉඩ තියන්න බැහැ සභාපතිතුමා මේක වහාම නවත්තන්න ඕනෙ. අනවසර ඉදිකිරීමක් කරොත් අපි කඩා හරිනවා. මේව අපිට හෙලි කරන්න සභාපතිතුමා. තිලකසිරි මහත්මයට වතුර දුන්නා. ඒක අනවසර ඉදිකිරීමක්. අදටත් ලිපිගොනුව මට පෙන්නල නෑ ලේකම්තුමා. සභාපතිතුමා මම ඒක අහපු වෙලාවෙ මට විහිළුවක් කරල ඒක මග හැරියා. මේ පාර ඒවගේ බැහැ. මේකට නිවැරදි තීරණයක් දෙන්න. එහෙම නොකලොත් අම්බලන්ගොඩ සියළුම ජනතාවට ඒ අයිතිවාසිකම දෙන්න කියන ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කථා කරමින්,</u>**

ගරු සභාපතිතුමනි මෙහිදී මට පෙනිච්ච කාරනේ තමයි කාගෙ හරි හිතවත් කමක් ඉස්සරහට දාගෙන මන්ත්‍රීවරු ටික කොටවල තමන් පෙනි පෙනී කරපු වැරැද්ද වහගන්න හදන එක තමයි කරන්නෙ. මේක බොහොම කණගාටුදායක තත්වයක්. මෙහිදී අපිට ලැබෙන ප්‍රතිඵලය ශූන්‍යයයි. ඔය පාර හදන්න ගිහිල්ල මම හය හත් පාරක් පොලිසි  ගියා. අවසානයේ වැරැද්ද කරපු කෙනා ජයග්‍රහණය කරනවා.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප්  මහතා කථා කරමින්,</u>**

මේ ජල සම්බන්ධය ලබා ගන්න මහත්මියගෙ පාර පළුදු වන ප්‍රමාණයට රු. 4172.78 ක් ගෙවල තියෙනවා. මේ මහත්මිය මේක බැකෝ දාල කැඩීම නිසා තාක්ෂණසේවා නිලධාරී මහත්මිය වාර්තා කරල තියෙනවා සිදුවූ අලාභය රු. 62591.00 ක් ලෙස. දැනට ගෙවා ඇති මුදල රු. 4172.78 ක් බැවින් අය කල ගත යුතු මුදල රු. 58418.98 ක් බවත් දන්වල තියෙනවා. තාම මෙම ස්ථානයට ජලය ලබා දීල නැහැ. වැඩ අධිකාරී මහත්මයත් මේ සම්බන්ධයෙන් නිර්දේශය දීල තියෙනවා. ඒක මම අනුමත කරල තියෙනවා. ඉන් පසු මොනිරා රෝෂිණී මහත්මිය විසින් ලිපියක් ඉදිරිපත් කරල තියෙනව ජලය ලබා ගැනීම සඳහා බැකෝ යන්ත්‍රයක් යොදා ගෙන මාර්ගය පළුදු කර බවත් එහිදි මාර්ගයට

අලාභයක් සිදුවී ඇති බව පිළිගන්නා බවත් එය තිබූ තත්වයට පත් කර දෙන ලෙසට පොරොන්දු වන බවටත් කපන ලද කාණුව ජලය ලබා ගන්නා තුරු නොවසන ලෙසත් ඉතා බැගෑපත්ව ඉල්ලා තිබූ අතර මම එය වාර්තා කරන්න දාල තියෙනවා. ඒ අනුව රු. 58418.98 ක් ගෙවන්න කියල දන්වල තියෙනවා. ඊට පසුත් ඒ මහත්මිය මේ මුදල අඩු කරල දෙන්න කියල ඉල්ලල තියෙනවා. නමුත් ඒක අපට කරන්න බැහැ. ඉන් පසුවත් නැවත ඉල්ලීමක් කරල තියෙනවා. නගර සභාවෙ කාර්මික නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ නගර සභා නීති රීති වල ට යටත්ව සාදා දෙන බවට පොරොන්දු වන බවත් ජලය ලබා දීමට අවසර ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණා. ඒ අනුව මම නියෝගයක් කරල තියෙනවා වැඩ අධිකාරී මහත්මයට සහ තාක්ෂණ සේවා නිලධාරී තුමියට ඔබතුමාලාගේ අධීක්ෂණය යටතේ මෙම කටයුත්ත ඉටු කල යුතුය කියා. ඉහත කරුණ ඉටු කිරීම ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය සමග එකගතාවයකට පත්විය යුතුය. එකගතාවය කඩ කලොත් ජල සැපයුම ලබා දිය නොහැක. ඊයේ වෙනකොට තාක්ෂණ සේවා නිලධාරී තුමිය වාර්තා කරනව එතුමිය මාර්ගය පළුදු කරන ලද ස්ථානයට ගිය බවත් ඒ වන විට ජල සැපයුමට අදාල එලීම් කර ඇති බවත් මාර්ගයේ එම කොටස් පිරවීම කර ඇති බවත් අදාල කාර්යය කරන පුද්ගලයන් පැවසුයේ 08 මස 09 දින එම කොන්ක්‍රීට් කිරීමේ කටයුත්ත සිදු කරන බවත්ය. එය අපගේ අධීක්ෂණය යටතේ සිදු කල යුතු බවත් මා විසින් දන්වන ලද බවත් සඳහන් කර තිබුණි. ඒ අනුව මා විසින් 1. අදාල මුදල් නගර සභාවට බඳින ලෙස දන්වන්න. 2. පොදු දේපල අලාභහානි සඳහා ඉදිරි කටයුතු කරන බව දන්වන්න 3. මින් 13/07/2012 දුන් නියෝගය අවලංගු කරන බව කියල මම නිර්දේශ කරල තියෙනවා.

මෙහිදී මම මතක් කරන්න ඕනෙ පාර කැඩීම සම්බන්ධයෙන් මුදල බැඳල තියෙන්නෙ. ඊට ඉක්මවා ගියපු මුදලක් තමයි තියෙන්නෙ. එවැනි අවස්ථාවකදී අලාභ ගෙවීම සම්බන්ධයෙන් අලාභ යථා තත්වයට පත් කිරීමට හෝ එම මුදල බඳින ලෙස කීමේ බලය සභාපතිවරයාට තියෙනවා. උදාහරණයක් වශයෙන් වාහනයක් ගිහිල්ලා වැටක හැප්පුවොත් අලාභය අය කර ගැනීම ඊට පහුවෙනිදම කරනවා. මන්ත්‍රීතුමිය කියපු ආකාරයෙන් වුනොත් මාසයක් වාහනය පොලිසියේ තියාගෙන ඉන්න වෙනවා. වාහනේ නිදහස් කරන්නෑ අදාල බැඳීම කරන්නෙ නැතුව. ඒ අනුව මේ අයට අපේ අධීක්ෂණය යටතේම නියමිත පරිදි ඒ අලාභය නිවැරදි කරන්න කියල තියෙනවා. දැනට කිරීම ප්‍රමාදවීම මත මෙය අවලංගු කරල සල්ලි බඳින්න කියල දන්වල තියෙනවා ලිඛිතව ලියා පදිංචි තැපෑලෙන්. මුදල් ගෙවීමට අපොහොසත් වුවහොත් පොදු දේපල අලාභ ගිණුම යටතේ නීති මගින් කටයුතු කරන බවටත් ලේකම්තුමා විසින් දන්වල තියෙනවා. යම් විදියකින් මේ සභාව අදහස් කරනව නම් මෙවැනි කටයුතු වෙනුවෙන් මම තීන්දුවක් නොගෙන සභාවේ අනුමැතිය ගන්න ඕනෙ කියල ඒක මට කිසිම ප්‍රශ්නයක් නැහැ. ඒකෙන් වන්නෙ මිනිස්සු අපහසුතාවයට පත් වෙන එක විතරයි. මේ සභාවෙ මීට පෙර මෙවැනි තීන්දු අරගත්ත ඒව තියෙනවා. මෙහිදී ප්‍රමිතිය පිළිබඳව අපට සහතිකය දෙන්නෙ වැඩ අධිකාරී වරයා. නියමිත ප්‍රමිතියට නැත්තම් ජලය ලබා දෙන්නෙ නැහැ.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කථා කරමින්,</u>

සභාපතිතුමනි මම ඔය සම්බන්ධව කතා කරන්න ඕනෙ. නමුත් කතා කරන්නෙ නැත්තෙ මගේ මෑතකදි ඇති වෙච්ච ඥාති කමක් තියෙන නිසා. මේ නගරයේ වැසියෙකුට යම් අකරතැබ්බයක් වුනොත් සාධාරණව විසඳීමේ අයිතිය සභාපතිතුමාට තිබිය යුතුයි. එය ප්‍රකාශ කරමින් මම ඒ ගැන කතා කිරීම නවත්තනවා.

එවගේම සභාපතිතුමනි මට හරිම සන්තෝෂයි. 1997 නගර සභා මන්ත්‍රීවරයෙක් ලෙස පත්වෙලා මගේ මූලික යෝජනාව වශයෙන් යෝජනා කරපු තල්ගස්ගොඩ බැද්ද ඉඩම අවුරුදු 15 ක් වැනි දීර්ඝ කාලයකින් පසුව ඊයේ දින මේකෙ භුක්තිය භාර ගත්තා. මම මේ සභාවට පත්වෙලා කරපු මුල්ම යෝජනාව මම මේ සභාවෙ නැවතත් මන්ත්‍රීවරයෙක්ව සිටියදී මේ යෝජනාව ක්‍රියාත්මක කරන්නට මට සහයෝගය දුන්නු එවකට මේ සභාව නියෝජනය කර ගරු සභාපතිතුමාම තමයි

අදත් මේ සභාවෙ ගරු සභාපතති තනතුරෙහි ඉන්නෙ. ඒවගේම මට ඒ අවස්ථාවෙදි සහයෝගය දුන්නු ජනිත් වික්‍රමතිලක මන්ත්‍රීතුමා සහ ජයන්ත මන්ත්‍රීතුමා. ඒ සියළු දෙනාටම ස්තුතිවන්ත වෙනවා මට සහයෝගය දීම පිළිබඳව. ඒ යෝජනාවෙ ඉදිරි කටයුතු කරන්න සභාපතිතුමනි මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා ඉඩම අපි පවර ගත්තෙ ක්‍රීඩා පිටියක් සහ පොදු කටයුත්තක් උදෙසා. මෙම ඉඩමේ ක්‍රීඩාංගණය සෑදීමේ කටයුතු ඇරඹීමට කටයුතු කරන ලෙස මා ඉල්ලා සිටිනවා. සම්පූර්ණ ඉඩම කැලෑ වෙලා තියෙන්නෙ. අක්කර තුනට පොඩි ප්‍රමාණයක් අඩුයි. මේ ක්‍රීඩා පිටියට වඩා විශාල එකක් හදන්න පුළුවන්. ගරු ප්‍රධාන අමාත්‍යතුමාත් උදව් කරනවා කිව්ව. මම ඉල්ලා සිටිනවා සභාපතිතුමනි ඉතා ඉක්මනින් JCB යන්ත්‍රයක් දාල මේක සුද්ධ කරන්න කියලා. මගේ යෝජනාව එදා ස්ථිර කරෙ ජනිත් මන්ත්‍රීතුමා. එතුමාටත් ජයන්ත මන්ත්‍රීතුමාටත් මෙයට සහයෝගය දුන්න සියළුම දෙනාටත් මම ස්තුතිවන්ත වෙමින් නිහඬ වෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කථා කරමින්,**

සභාපතිතුමනි මම මෙතුමට පොඩ්ඩක් මතක් කරල දෙන්න ඕනෙ. අක්කර 5 ක් අපි යෝජනා කරෙ. ඒ කාලෙ ලක්ෂ 10 කට වැඩි මුදලක් තැන්පත් කරල. ඔතන පොදු පහසුකම් ඒවගේම පුස්තකාල විශේෂයෙන්ම අපේ යෝජනාවෙ තිබුණෙ සුසාන භූමිය. ඒ පැත්තට සුසාන භූමියක් අවශ්‍යයි කියන නිසා. ඊළඟට නිවාස වලටත් වෙනම තිබුණා. ඔකෙ සල්ලි බැන්දෙ ජී. එම්. එස්. ද සිල්වා මහත්මයගේ කාලෙදි ජනිත් මහත්මය හිටියෙත් නැහැ. ඕක යෝජනා කරල සල්ලි බැන්දෙ ඒ කාලෙ. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සල්ලි බැඳල තියෙන්නෙ. ඒ මුදලෙ පොලී අපට එන විදියට.

**ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,**

යෝජනාව ශ්‍රී. ල. නි. ප. මන්ත්‍රී වික්‍රමතිලක මහත්මයගෙ. ජනිත් මහත්මයගේ තාත්තගේ.

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කථා කරමින්,**

1986 දිනෙ ගත්තෙ. කෙරමිණිය තල්ගස්ගොඩ ගන්න කියල යෝජනා කරෙ ඒ මහත්මයගේ තාත්තා. ස්ථිර කරෙ මම. මෙතන ගොඩක් ප්‍රශ්න ඇවිල්ල තමයි ඔය තත්වෙට ආවෙ. අක්කර 5 ක් තිබුන එක තමයි අක්කර දෙක හමාරට බැස්සෙ. මේකෙ යෝජනාවක් තියෙනවා සුසාන භූමියකුත් ඕනෙයි කියලා. අද ඒ ප්‍රමානෙ හරි නගර සභාවට ලැබීම ගැන සතුටු වෙනවා. ඔබතුමා කියපු ක්‍රීඩාංගණය යෝජනාවත් සලකා බැලිය යුතුයි. තල්ගස්ගොඩ වුනත් කමක්නෑ හොඳ ක්‍රීඩා පිටියක් තියෙනව නම්. ඒ නිසා සුදුසු කටයුත්තක් කරල පුළුවන්නම් අයිනකින් සුසාන භූමියකුත් හදල අවශ්‍ය කටයුතු කරන්න අපේ සහයෝගය ලැබෙනවා.

**ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,**

1997 දි අපි පත් වුනහම පළවෙනි යෝජනාව. නවක මන්ත්‍රීවරුන්ට තේරෙනව ඇති යෝජනාවක් සපල වෙන්න කොච්චර කල් යනවද කියල. ජී. එම්. එස්. ද සිල්වා මහත්මය ප්‍රමුඛ කණ්ඩායමටත් අපේ ස්තුතිය හිමි වෙනවා.

ඒවගේම අපේ සියළු මන්ත්‍රීවරුන්ට දැනුම් දෙනවා 2013 වර්ෂය සඳහා අයවැය යෝජනා ඉදිරිපත් කරන්න කියලා.

**ප. ව. 02.00 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් කරන ලදී.**

| | |
|---|---|
| ඩී. වී. සුනිල්, | එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප්, |
| ලේකම්, | සභාපති, |
| අම්බලන්ගොඩ නගර සභාව. | අම්බලන්ගොඩ නගර සභාව. |

**2012 – 08 – 27 දින,**

**අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේදීය.**